ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය

பிரதேச அபிவிருத்தி அமைச்சு

Ministry of Regional Development

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

# இலங்கை ஹதபிம அதிகாரசபை

# HADABIMA AUTHORITY OF SRI LANKA







# වාර්ෂික වාර්තාව

## வருடாந்த அறிக்கை

## ANNUAL REPORT

# 2016



# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

## වාර්ෂික වාර්තාව - 2016


කොළඹ කාර්යාලය ඃ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය,

3 වැනි මහල, නො ඃ 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

මහනුවර කාර්යාලය ඃ තැ.පෙ. 09, ගන්නෝරුව, පේරාදෙණිය.

දුරකථන ඃ 011-3355098 / 0812-388107

ෆැක්ස් ඃ 0812-388132

විද්‍යුත් තැපෑල ඃ authority@hadabima@gmail.com

වෙබ් අඩවිය ඃ www.hadabima.gov.lk

## පටුන


| | පිටු අංක |
|---|---|
| 01. ගරු සභාපතිතුමාගේ පණිවිඩය | 1 |
| 02. නියෝජ්‍ය සභාපතිතුමාගේ පණිවිඩය | 2 |
| 03. විධායක අධ්‍යක්ෂතුමියගේ පණිවිඩය | 3 |
| 04. දැක්ම හා මෙහෙවර | 4 |
| 05. හැඳින්වීම | 5 |
| 06. පාලන අංශයේ තොරතුරු | 6-11 |
| • පාලන අංශය - ආයතනික තොරතුරු | 6-8 |
| • අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වූ දින | 9 |
| • අනුමත සේවක සංඛ්‍යාව | 10 |
| • සංවිධාන සටහන | 11 |
| 07. 2016 වර්ෂයේ සංවර්ධන වැඩසටහන | 12-18 |
| • මූලික සංරක්ෂණ සැලසුම්කරණය | 12 |
| • ග්‍රාමීය නායකත්ව සංවර්ධන වැඩසටහන | 13 |
| • විෂයානුබද්ධ පුහුණු වැඩසටහන | 14 |
| • පාංශු සංරක්ෂණ ආදර්ශන ස්ථාපිත කිරීම | 15 - 15 i |
| • "සොබා සිසු නැණ පවුර" පාසැල් පාරිසරික වැඩසටහන | 16 – 16 i |
| • ජල මූලාශ්‍ර දිය කඳුරු සංරක්ෂණ වැඩසටහන | 17 – 17 i |
| • පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීමේ වැඩසටහන | 18 – 18 i |
| • සැලසුම්කරණය හා ප්‍රගති සමාලෝචනය | 18 ii |
| • ආයතනික මානව හා භෞතික සම්පත් සංවර්ධනය | 18 ii |
| 08. අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 19-24 |
| 09. ගිණුම් තොරතුරු | 25-36 |
| 10. විගණන තොරතුරු (2016-12-31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව | 37-51 |



## ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ පාරිසරික ලෙස සංවේදී කලාපවල සිදුවන විවිධාකාරී වූ පරිසර අසමතුලිතතාවයන් මේ වන විට ජාතික ගැටළුවක් බවට පත් වී ඇත. මේ අතරින් මෙම ප්‍රදේශවල සිදුවන පාංශු ඛාදනය පරිසරය අසමතුලිත කරනු ලබන ප්‍රධාන සාධකයක් බවට පත්ව ඇත. මෙම ප්‍රදේශවල පැවති සශ්‍රීක වන ආවරණය යටත් විජිත සමයේ ආදේශ කරන ලද වැවිලි ආර්ථික භෝග හේතුවෙන් විනාශ වීම මෙම සමතුලිත වූ පරිසර පද්ධතිය අසමතුලිත කිරීමට හේතු වී ඇති අතර එමගින් සිදු වන පාංශු ඛාදනය, පාංශු හායනය ඉන් සමහරකි. මෙම තත්වයන් අවම කිරීම සඳහා 1972 අංක 11 දරණ කෘෂි කර්ම නීතිගත සංස්ථා පනතට අනුව 1978 වර්ෂයේ ජාතික කෘෂිකර්ම විවධාංගීකරණය හා ජනාවාස සංවර්ධන අධිකාරිය ආරම්භ විය. ඉන්පසු 1991 වර්ෂයේ මෙම අධිකාරිය තවදුරටත් පුළුල් කිරීම සිදු වූයේ ආයතනයේ නිල නාමය ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය (ශ්‍රී ලංකා හදබිම අධිකාරිය) ලෙස සංශෝධනය වෙමින්ය. එම කාලය තුළ විවිධ ජාත්‍යන්තර මූල්‍ය ආයතනික ප්‍රතිපාදන මත ක්‍රියාත්මත වූ මෙම අධිකාරිය මහා භාණ්ඩාගාර මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ මෙම ආයතනයේ ක්‍රියාකාරීත්වයේ ජාතික වැදගත්කම වටහා ගැනීමත් සමගය.

මෙවැනි විකාශ අවධි පසු කරන ලද ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ඉලක්කගත ප්‍රදේශවල මේ වන විට ඉඩම් හෙක්ටයාර් 75000කට ආසන්න ප්‍රමාණයක් ගොවිපවුල් 125000 ආසන්න පිරිසකගේ ප්‍රජා සහභාගීත්වයෙන් සංවර්ධනය කර ඇත. මෙහි පාරිසරික, සමාජයීය හා ආර්ථික වටිනාකම අති විශාල වන අතර මෙමගින් ජාතීන් කෘෂිකාර්මික ආගමන ක්ෂේත්‍රය සඳහා ලබා දෙන දායකත්වය ද සුවිශේෂී වේ.

2016 වර්ෂයේ මෙම ආයතනයේ ඉතිහාසය තුළ හමුවන සාධනීය හැරවුම් ලක්ෂය ලෙස අපට හමු වන්නේ පුරා වසර 30කට ආසන්න කාලයක් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත්වූ මෙම ආයතනය නව රජයේ සංවර්ධනාත්මක දැක්මට අනුව ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතට පත්වීමය.

මෙ සමඟින් අධිකාරිය දීප ව්‍යාප්ත සංවර්ධන කාර්යයන් ඉටු කරනු ලබන ආයතනයක් බවට පත් වීමත් ඒ තුළ පාරිසරික, සමාජ, ආර්ථිකමය වශයෙන් උපාය මාර්ග හඳුනා ගැනීමටත් කටයුතු කිරීම අධිකාරිය ලද සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකිය. මෙම පසුබිම යටතේ 2016 වර්ෂයේ සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු.මි. 70 මුදලක් ලබා දෙන අතර මෙම මුදල උපයෝගී කර ගනිමින් කෑගල්ල, රත්නපුර, මහනුවර, මාතලේ, නුවරඑළිය, කුරුණෑගල, බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 40 ක් ආවරණය කරමින් ඉඩම් හෙක්ටෙයාර 3000 සංරක්ෂණය කර සංවර්ධනය කිරීම ඉලක්කය විය.

ඒ අනුව 1978 අංක 38 දරණ මුදල් පනතේ 40 – 2 වගන්තිය ප්‍රකාරව 2016 වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරනු ලබන අතර 2016 ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් ඉලක්කයන් සාර්ථක ලෙස නිම කිරීම සඳහා ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා, ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලය දක්වන ලද සුහදශීලී මැදිහත්වීම සම්බන්ධව මාගේ ස්තූතිය පුද කරනු ලබන අතරම එලෙසම මෙම සංවර්ධන වැඩසටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉතා කැපවීමෙන් කටයුතු කළ නියෝජ්‍ය සභාපතිතුමා, විධායක අධ්‍යක්ෂතුමිය ඇතුළු කාර්යය මණ්ඩලය වෙත මාගේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටිමි.

නන්දසේන හේරත්
සභාපති



**<u>ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ</u>**

**<u>නියෝජ්‍ය සභාපතිතුමාගේ පණිවිඩය</u>**

ලොව සෑම රටක්ම පරිසර සංරක්ෂණය, තිරසාර සංවර්ධනය, ධරණීය සංවර්ධනය යන කරුණු පිළිබඳ අන් කවරදාටත් වඩා අවධානය යොමු කර ඇත. එම තත්වයට ප්‍රධානතම හේතුවක් නම් මානව ක්‍රියාකාරකම් වල සෘජු ප්‍රතිඵලයක් ලෙස පරිසර පද්ධතිය අසමතුලිත වීම හා එම අසමතුලිත වීමේ ප්‍රතිඵලයක් ලෙස සමස්ථ මානව සමාජයම තර්ජනයකට ලක් වී තිබීමයි. ඒ අනුව විශාල භූගෝලීය විවිධත්වයක් සහිත ශ්‍රී ලංකාවද පරිසරය ආරක්ෂා කර ගනිමින් මානව සමාජය සුරක්ෂිත කිරීමේ අභියෝගයකට අද මුහුණ පා ඇත.

මෙම අභියෝගය ජය ගැනීම සඳහා වෙර වීරිය දරණ රාජ්‍ය ආයතන අතලොස්සක් අතරින් ශ්‍රී ලංකා හදබිම අධිකාරියට සුවිශේෂ ස්ථානයක් හිමි වනුයේ පරිසර අසමතුලිත කිරීමේ ප්‍රධානතම සාධකයක් වන පාංශු ඛාදනය අවම කිරීම සඳහා සිදු කරනු ලබන මැදිහත් වීම තුළය. ගත වූ වසර 100ක කාලය තුළ ශ්‍රී ලංකාවේ සමස්ථ භූමියෙන් සෙ.මී. 30 ප්‍රමාණයක් සරුපස මුහුදට ගලා ගොස් ඇත. ශ්‍රී ලංකාවේ සමස්ථ භූමියෙන්1/3ක ප්‍රමාණයක් ආන්තික ඉඩම් බවට පත් වීමේ අවධානමක් පවතින බව පසුගිය දා ජාතික පරමාණු බලශක්ති අධිකාරිය අනාවැකි පළ කළේය. එලෙසම ශ්‍රී ලංකාවේ සමහර ප්‍රදේශ කාන්තාරකරණයට ලක් වන බව ලෝක පාරිසරික සංවිධානය පෙන්වා දෙනු ලබයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ වායුගෝලීය උෂ්ණුසුම ඉහළ යාමේ අවධානමක් පවතින බව ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙනු ලබයි.

මේ සියළුම අනාවැකි මත අප යොමු විය යුතුව ඇත්තේ පරිසර සමතුලිතතාවය ආරක්ෂා කර ගැනීමේ අභියෝගය ජය ගැනීම සඳහාය. මෙම අරමුණ ඇතිව 1978 ආරම්භ කරන ලද ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණ හා ජනාවාස සංවර්ධන අධිකාරිය විවිධ විකාශන අවධීන් පසු කර මේ වන විට ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ලෙස මෙම කාර්යය සඳහා වඩා සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත. මෙම විකාශන අවධි තුළ වඩාත් සාධනීයම පරිවර්තනය වූයේ 2016 වර්ෂයේ ශ්රී ලංකා හදබිම අධිකාරිය කෘෂිකර්මාන්ත විෂය පථයෙන් ඉවත්ව ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් වීමය. ඒ අනුව වඩා පුළුල් වූ සමාජමය/ පාරිසරිකමය මානව සුභසාධනමය කාර්යයභාරයක් ඉටු කිරීමේ මංපෙත් විවරව ඇත. 2016 වර්ෂය මේ සඳහා නෛතික පරිසරය නිර්මාණය කර ගැනීමට හැකි වීම අධිකාරිය ලත් සුවිශේෂී ජයග්‍රහණයකි. එලෙසම මෙම අරමුණු පරමාර්ථ ඉලක්ක කර ගත් 2016 ක්‍රියාත්මක සංවර්ධන සැලැස්මෙහි අන්තර්ගත වූ සංවර්ධන ක්‍රියාකාරකම් තුළ ඉහළ කාර්ය සාධනයක් ලබා ගැනීමට හැකි වීම පිළිබඳව අතිශයින් සතුටු වෙමි. ඒ අනුව 2016 ක්‍රියාත්මත සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා අධිකාරිය නව සංවර්ධනාත්මක ප්‍රවේශයකට යොමු කිරීම සඳහා අවශ්‍ය සහාය හා මගපෙන්වීම ලබා දුන් ප්‍රාදේශීය සංවර්ධන විශයභාර ගරු අමාත්‍යතුමාටත් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුලු සමස්ත කාර්යය මණ්ඩලයටත් මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.

එමෙන්ම අධිකාරියේ සමස්ථ සංවර්ධන වැඩසටහන තුළින්ම ඉහළ කාර්යය සාධනයක් අත්කර ගැනීම සඳහා ඉතා කැපවීමෙන් කටයුතු කළ සභාපතිතුමා විධායක අධ්‍යක්ෂතුමිය ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලය ගෞරවයෙන් සිහිපත් කළ යුතුව ඇත.

ලලීන්ද්‍ර නාගහතැන්න
නියෝජ්‍ය සභාපති



## ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ

## විධායක අධ්‍යක්ෂතුමියගේ පණිවිඩය

පුරා වසර 40 කට ආසන්න කාලයක් කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වූ ශ්‍රී ලංකා හදබිම අධිකාරිය නව රජයේ දැක්මට අනුව 2016 වර්ෂයේ සිට ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට යටත් කරන ලදී. එමඟින් ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධනාත්මක ප්‍රවේශය නව දිසානතියකට යොමු කර ඇත. ඒ අනුව දිස්ත්‍රික් කිහිපයකට සීමා වූ අධිකාරියේ කාර්යභාරය දීපව්‍යාප්ත කිරීමට කටයුතු සැලසුම් කර ඇත. එලෙසම මෙතෙක් පාරිසරික සංරක්ෂණය කේන්ද්‍රීය වුත් යැපුම් කෘෂිකර්මාන්තය හා වර්ධනය ඉලක්ක වුත් අධිකාරියේ සංවර්ධන වැඩසටහන් එම අනන්‍යතාවයන්ට හානි නොවන පරිදි වාණිජ කෘෂිකර්මාන්ත ප්‍රවර්ධනය හා කෘෂිකාර්මික ප්‍රවර්ධනය සඳහා ද යොමුව ඇත.

2016 වර්ෂයේ මුල් කාල සීමාව තුළ සිදු වූ මෙම පරිවර්තනය තුළ මෙම නව ප්‍රවේශයන් සඳහා මූලික පසුබිම සකස් කරන ලද අතර 2016 යෝජිත වූ ක්‍රියාත්මක සංවර්ධන සැලැස්මට අනුව එම වර්ෂයේ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලබාදෙන ලද මිලියන 58.861 ක මුදලක් උපයෝගී කර ගනිමින් පාංශු සංරක්ෂණය හා දියබෙත්ම කළමනාකරණය මූලික කරගත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර අදාළ ඉලක්කය සපුරා ගැනීමට හැකිවීම ජයග්‍රහණයකි. විශේෂයෙන් අධිකාරියේ ප්‍රමුඛතම සංවර්ධන කාර්යය වන පාංශු ඛාදනය අවම කිරීම යටතේ ඉඩම් හෙක්ටයාර 2741 ප්‍රමාණයක් සංරක්ෂණය කිරීමට හැකි වී ඇත. මෙම සංවර්ධන වැඩසටහන් වලට අමතරව අධිකාරියෙහි විශේෂ ආදායම් උත්පාදන වැඩසටහන ලෙස ක්‍රියාත්මක කරනු ලබන අලෙවි වැඩසටහන තුළින් රු. මිලියන 79 ක් වටිනා කෘෂි නිෂ්පාදන මෙම ඉලක්කගත වර්ෂය තුල මිලට ගෙන ඇත. එය අතරමැදියන්ගේ ග්‍රහණයට හසු වූ කෘෂි නිෂ්පාදනයන් එම තත්වයෙන් මුදවා ගැනීමට ගත් සාධනීය වූ උත්සාහයකි.

ඒ අනුව 2016 වර්ෂය තුළ ඉලක්කගත සංවර්ධන වැඩසටහන් සාර්ථක ලෙස නිම කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම හා සහාය ලබාදුන් ප්‍රාදේශීය සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාටත් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය වෙත මාගේ ස්තූතිය පුද කරනු ලබන අතර මෙම සංවර්ධන වැඩසටහන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී මා හට අවශ්‍ය සහය ලබා දුන් සභාපතිතුමා නියෝජ්‍ය සභාපතිතුමා ඇතුළු හදබිම අධිකාරියේ කාර්යය මණ්ඩලයද සිහිපත් කරනුයේ ඉතා ගෞරවයෙනි.

කේ.එස්. ප්‍රේමචන්ද්‍ර
විධායක අධ්‍යක්ෂ

## දැක්ම

“ සරු පසින් සරු පොළොවක්

සරු පොළොවෙන් සරු සාර

අස්වැන්නක් සපිරි රටක් ”

## මෙහෙවර

“ පාංශු ඛාදනය අවමකර

පාංශු සංරක්ෂණය තුලින්

භූමිය සරු කර සරු ඵල ගන්වා

දේශීය ආහාර සුරක්ෂිතතාවය තහවුරු කර

දේශීය කෘෂි නිෂ්පාදන

ඉහළ දැමීමට හවුල් වීම ”

# හැඳින්වීම

1972 අංක 11 දරණ කෘෂිකර්ම නීතිගත සංස්ථා පනත යටතේ අංක 302/12 - 1978 පෙබරවාරි 01 වැනි දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ආරම්භයේදී ජාතික කෘෂිකාර්ම විවිධාංගීකරණ හා ජනාවාස සංවර්ධන අධිකාරිය ලෙස (නැඩ්සා) මෙම ආයතනය ස්ථාපිත කර ඇත.

ආරම්භයේදී මෙම ආයතනය පිහිටුවීමේ පරමාර්ථය වී ඇත්තේ යටත් විජිත සමයේ නිමාව සමඟම ඔවුන් විසින් වැවිලි ආර්ථිකයට නතුකරගත් පසුව කිසිදු නඩත්තු කටයුත්තක් නොමැතිව ආන්තික තත්ත්වයට පත් ඉඩම් හේතුවෙන් මධ්‍යම කඳුකරය හා ඒ ආශ්‍රිත සිදුවන පාංශු ඛාදනය මූලික වූ පරිසර අසමතුලිතතාවය අවම කිරීමය. මෙම කාර්ය ඉටු කිරීම සඳහා ප්‍රජා දායකත්වය ලබා ගැනීමේ අරමුණින් මෙම ඉඩම් ගොවීන් අතර බෙදාදී පදිංචිවීමට අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීම තුල මෙම ප්‍රදේශ මානව ජනාවාස බවට පත් කරමින් සංරක්ෂණ හා සංවර්ධන කටයුතු මුලින් ආරම්භ කර ඇත්තේ කෑගල්ල හා මහනුවර යන දිස්ත්‍රික්කයන්ය. මහවැලි හා මාඔය යන ප්‍රධාන ගංගාවලට අයත් ජලපෝෂක ප්‍රදේශ ආවරණය කරමින් මෙම ව්‍යාපෘතිය 1978 වර්ෂයේ ආරම්භ කර ඇත.

මෙතෙක් භාවිතා කල නාමය වූ "ජාතික කෘෂිකර්ම විවිධාංගීකරණ හා ජනාවාස සංවර්ධන අධිකාරිය" යන්න වෙනුවට "ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය" යන කෙටි නමින් හැඳින්විය හැකි පරිදි "හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය" යන නාමය 1991.11.07 දිනැති 687/15 දරණ ගැසට් නිවේදනයෙන් පවරා ඇත. 1992 වර්ෂයේ කැබිනට් මණ්ඩල අනුමැතියක් යටතේ මහනුවර සහ කෑගල්ල දිස්ත්‍රික්කවලට අමතරව මොණරාගල, බදුල්ල, රත්නපුර, නුවරඑළිය යන දිස්ත්‍රික්කවලට ව්‍යාප්තවීමට අවශ්‍ය අනුමැතිය ලබාදී ඇත.

මෙලෙස ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිය සඳහා මුදල් ආධාර පළමුව ලෝක බැංකුව මගින් හා දෙවන අදියර යටතේ ලෝක ආහාර සංවිධානයෙන් ලබාදී ඇත. එම ආධාර කාලසීමාවන් නිමා වූ පසු ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරය වෙතින් මේ සඳහා මූල්‍ය ආධාර ලබා දෙන ලදි. ඒ අනුව වාර්ෂිකව ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන මත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

1978 සිට 2016 මාර්තු 15 වන දින දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පැවැති මෙම අධිකාරිය 2016 මාර්තු 18 දිනැති අංක 1958/12 දිනැති ගැසට් නිවේදනයෙන් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කොට ඇත. 2016 වර්ෂයේ මෙම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය වෙත ලබාදෙන ලද මුදල රු.මි. 58.861 කි. මෙම මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය යොදා ගනිමින් කෑගල්ල, මහනුවර, මාතලේ, නුවරඑළිය, රත්නපුර, කුරුණෑගල හා බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 ක් ආවරණය වන පරිදි අදාල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව 2016 වර්ෂය තුල පහත සඳහන් සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘති බල ප්‍රදේශ තුල ක්‍රියාත්මක කරන ලදි.

# පාලන අංශයේ තොරතුරු

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය
# 2016 වාර්ෂික වාර්තාව

<u>පාලන තොරතුරු</u>

01. <u>අධ්‍යක්ෂ මණ්ඩලය</u> - (2016 ජනවාරි සිට පෙබරවාරි මස දක්වා)

| | | | |
|---|---|---|---|
| 1. | නන්දසේන හේරත් මහතා - සභාපති | - | අධ්‍යක්ෂ මණ්ඩල සභාපති |
| 2. | ජී.අජිත් පුෂ්ප කුමාර මහතා - නියෝජ්‍ය සභාපති | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 3. | එච්.එම්.පී.හිටිසේකර මහතා - භාණ්ඩාගාර නියෝජිත | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 4. | ශාන්තිනි කොන්ගහගේ මහත්මිය | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 5. | ඩී.එම්.සිරිසේන දිසානායක මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 6. | ඩී.එන්.ඩී.නුගවෙල මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 7. | ආචාර්ය එච්.එම්.එස්.හීන්කෙන්ද මහතා -අමාත්‍යාංශ නියෝජිත | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

<u>අධ්‍යක්ෂ මණ්ඩලය</u> - (2016 ඔක්තෝබර් මස සිට දෙසැම්බර් මස දක්වා)

| | | | |
|---|---|---|---|
| 1. | නන්දසේන හේරත් මහතා - සභාපති | - | අධ්‍යක්ෂ මණ්ඩල සභාපති |
| 2. | ලලින්ද්‍ර නාහගතැන්න මහතා - නියෝජ්‍ය සභාපති | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 3. | එච්.එම්.පී.හිටිසේකර මහතා - භාණ්ඩාගාර නියෝජිත | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 4. | පී.එච්.ආනන්ද මහතා - අමාත්‍යාංශ නියෝජිත | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 5. | කේ.චන්දිම පීරිස් මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 6. | උපාලි ගුණවර්ධන මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 7. | එල්.ජී.ගැමුණු ද සිල්වා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

1972 අංක 11 දරණ ජාතික කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත අනුව 1978 පෙබරවාරි 01 දිනැති අංක 302/12 දරණ ගැසට් නිවේදනයෙන් "ජාතික කෘෂිකර්මික විවිධාංගීකරණ සහ ජනාවාස සංවර්ධන අධිකාරිය" (නැඩිසා) ස්ථාපිත කරන ලදි. 1991 නොවැම්බර් 07 දිනැති අංක 678/15 දරණ ගැසට් නිවේදනය මගින් "ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණ සහ ජනාවාස සංවර්ධන අධිකාරිය" (නැඩිසා) යන්න වෙනුවට "ශ්‍රී ලංකා හදබිම අධිකාරිය" යන කෙටි නමින් හැඳින්විය හැකි පරිදි, "ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය" ලෙස සංශෝධනය කර ඇත. මෙම අධිකාරිය 1978 වර්ෂයේ සිට 2016 මාර්තු මස 15 දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පාලනය විය.

2016 මාර්තු මස 18 දිනැති අංක 1958/72 දරණ ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය (හදබිම) 2016 මාර්තු මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කරන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් -

2016 ජනවාරි මස සිට පෙබරවාරි මස දක්වා ගරු කෘෂිකර්ම අමාත්‍ය තුමා විසින් පත් කරන ලද සභාපති තුමා, නියෝජ්‍ය සභාපති තුමා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහතුන් යටතේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන ලදි.

2016 මාර්තු මස හදබිම අධිකාරිය ප්‍රාදේශිය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කිරිමෙන් පසු, ගරු ප්‍රාදේශිය සංවර්ධන අමාත්‍ය තුමා විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016 ඔක්තොබර් මස සිට දෙසැම්බර් මස දක්වා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන ලදි.

## 02. කාර්ය මණ්ඩල විස්තර -

1. 2016 වර්ෂයේ අධිකාරියේ සභාපති ලෙස නන්දසේන හේරත් මහතා කටයුතු කරන ලදි.

2. 2015-03-10 දින 2016-10-18 දින දක්වා අධිකාරියේ උපසභාපති ලෙස ජී.අජිත් පුෂ්ප කුමාර මහතා සේවය කළ අතර, අමාත්‍යාංශ වෙනස් විමත් සමග එතුමා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සේවය සඳහා වාර්තා කර ඇත.

3. ප්‍රාදේශිය සංවර්ධන නව අමාත්‍යාංශය යටතේ අධිකාරියේ නියෝජ්‍ය සභාපති ලෙස 2016-10-11 දින සිට ලලින්ද්‍ර නාගහතැන්න මහතා පත් කර ඇත.

4. අධිකාරියේ විධායක අධ්‍යක්ෂ ලෙස ද්විතියන පදනම මත සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු වන ජේ.සී.රණේපුර මහතා, මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුරප්පාඩු වූ අතිරේක දිසාපති (ඉඩම්) තනතුර සඳහා 2016-02-24 දින සිට ඉවත්ව යන ලදි.

5. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියක වන ඒ.එම්.සී.කේ අතුපත්තු මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුරේ සේවය කළ අතර, එම තනතුරේ සේවය කරමින්, පුරප්පාඩු වූ විධායක අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ද ඉටුකරන ලදි. ද්විතියන පදනම මත මෙම අධිකාරියේ සේවයට පැමිණ සිටි නියෝජ්‍ය අධ්‍යක්ෂ තුමියද 2016-06-03 දින මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති පේෂකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුර සඳහා ඉවත්ව යන ලදි.

6. අධිකාරියේ පුරප්පාඩු වූ විධායක අධ්‍යක්ෂ තනතුර සඳහා මධ්‍යම පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ලෙස සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරිනියක වන කුමුදිනි එස් ප්‍රේමචන්ද්‍ර මහත්මිය 2016-06-02 දින සිට අධිකාරියේ වැ.බ. විධායක අධ්‍යක්ෂ ලෙසත් නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) ලෙසත් පත් කර ඇත.

7. අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරේ ඩී.එම්.ඒ.බී.දසනායක මහතාත්, සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති හා සැලසුම්) තනතුරේ බී.ටී.එස්.ඩබ්.කුමාර මහතාත්, සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ ඒ.එම්.වසන්ත බණ්ඩාර තිලකරත්න මහතාත්, 2016 වර්ෂයේ දී සේවය කරන ලදි..

8. අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන අලෙවි ව්‍යාපෘතියේ සහකාර අධ්‍යක්ෂ ලෙස ඉඳුනිල් කේ වැලිගමගේ මහතා 2016 වර්ෂයේ සේවය කරන ලදි.

## 03. <u>ආයතනය සතු භෞතික සම්පත්</u> -

<u>ගොඩනැගිලි</u> -

1. අධිකාරියේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන පර්චස් 46 ක භූමි භාගයක් ද
2. පල්ලේකැලේ ගොවිපල පවත්වාගෙන යනු ලබන අක්කර 08 ක භූමියක් ද,
3. කොත්මලේ ගොවිපල පවත්වාගෙන යනු ලබන අක්කර 05 ක භූමියක් ද,
4. පේරාදෙණිය, සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ පර්චස් 40 භූමිය භාගයක පිහිටි නිල නිවාසයක් ද සහිත ඉඩම් සහ ගොඩනැගිලි ද,
5. ගන්නෝරුව උද්‍යාන විද්‍යා ගොවිපල අසල පිහිටා ඇති ගොඩනැගිලි සහ ඉඩම පර්චස් 80 පමණ කොටස අධිකාරිය සතුව ඇත.

<u>වාහන</u> -

2016 වර්ෂය වන විට අධිකාරිය සතුව කැබ් රථ 11 ක්, කාර් 01, පෙජරෝ රථ 01 ක් ද, ලොකු ලොරි රථ 01 ක් සහ පොඩි ලොරි රථ 01 ක් ද, ආයතනය සතු යතුරු පැදි 2 ක් ද, ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ලබා දුන් යතුරු පැදි 20 ක් ඇත. ගොවිපල් සඳහා ට්‍රැක්ටර් 03 ක්ද , හමුදා කඳවුරු වෙත (රෝද 02) ට්‍රැක්ටර් 03 ක් ලබා දී ඇත. අලෙවි ව්‍යාපෘතිය සතුව ලොකු ලොරි රථ 01 ක් සහ බොලෙරෝ ලොරි 01 ලෙස වාහන 45 ක් ඇත.

2016 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත් වූ දින

| අනු අංකය | අධ්‍යක්ෂ මණ්ඩලය | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත් වූ දින හා සහභාගි වූ අය | |
|---|---|---|---|
| | | 22/01/2016 | 18/02/2016 |
| 1 | නන්දසේන හේරත් මහතා සභාපති, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | √ | √ |
| 2 | ජී.අජිත් පුෂ්පකුමාර මහතා නියෝජ්‍ය සභාපති, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | √ | 0 |
| 3 | ආචාර්ය එච්.එම්.එස්.හීන්කෙන්ද මහතා අමාත්‍යාංශ නියෝජිත අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | 0 |
| 4 | එච්.එම්.පී.හිටිසේකර මහතා, භාණ්ඩාගාර නියෝජිත, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | √ |
| 5 | ශාන්තිනි කෝන්ගහගේ මහත්මිය, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | √ |
| 6 | ඩී.එම්.සිරිසේන දිශානායක මහතා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | √ |
| 7 | ඩී.එන්.ඩී.නුගවෙල මහතා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | √ |

| අනු අංකය | අධ්‍යක්ෂ මණ්ඩලය | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත් වූ දින හා සහභාගි වූ අය | | |
|---|---|---|---|---|
| | | 31/10/2016 | 25/11/2016 | 29/12/2016 |
| 1 | නන්දසේන හේරත් මහතා සභාපති, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | √ | √ | √ |
| 2 | ලලීන්ද්‍ර නාගහතැන්න මහතා නියෝජ්‍ය සභාපති, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | √ | √ | √ |
| 3 | එච්.එම්.පී.හිටිසේකර මහතා, භාණ්ඩාගාර නියෝජිත, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | √ | √ |
| 4 | පී.එච්.ආනන්ද මහතා , අමාත්‍යාංශ නියෝජිත - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | 0 | √ |
| 5 | කේ.චන්දිම පීරිස් මහතා , අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | √ | √ |
| 6 | එල්.ජී.ගැමුණුද සිල්වා මහතා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | √ | √ |
| 7 | උපාලි ගුනවර්ධන මහතා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | 0 | 0 |

| | |
|---|---|
| සහභාගීවීම | √ |
| නොපැමිණීම | 0 |


2016 මාර්තු මස හදබිම අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් විය. ඉන්පසු නව අමාත්‍යවරයෙකු පත්වීම නිසා පැවැති අධ්‍යක්ෂ මණ්ඩලය නිල කාලය අහෝසි වූ අතර, නව අධ්‍යක්ෂ මණ්ඩලය 2016 ඔක්තෝබර් මස සිට පත් කරන ලදි. ඒ අනුව ජනවාරි සිට පෙබරවාරි දක්වාත් නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්වීමෙන් පසු ඔක්තෝබර් සිට දෙසැම්බර් මස දක්වා අවස්ථා 05 දී රැස්විය.

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 1 | විධායක අධ්‍යක්ෂ | 1 |
| 2 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | 1 |
| 3 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) | 1 |
| 4 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | 1 |
| 5 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි) | 1 |
| 6 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාපෘති හා සැලසුම්) | 1 |
| 7 | පරිපාලන නිලධාරි | 1 |
| 8 | මූල්‍ය නිලධාරි | 1 |
| 9 | අලෙවි නිලධාරි | 1 |
| 10 | කෘෂිකර්ම සංවර්ධන නිලධාරි | 2 |
| 11 | අභ්‍යන්තර විගණන නිලධාරි | 1 |
| 12 | කලාප නිලධාරි | 12 |
| 13 | කාර්මික නිලධාරි | 1 |
| 14 | කළමනාකරණ සහකාර (තාක්ෂණික) | 35 |
| 15 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 19 |
| 16 | සරප් | 1 |
| 17 | යන්ත්‍ර ක්‍රියාකරු | 2 |
| 18 | ශ්‍රව්‍ය දෘෂ්‍ය සහායක | 1 |
| 19 | කාර්මික සහායක | 2 |
| 20 | රියදුරු | 14 |
| 21 | කාර්යාල කාර්ය සහායක | 4 |
| 22 | රිය සහායක | 3 |
| 23 | මුරකරු | 4 |
| 24 | කම්කරු | 2 |
| 25 | ගොවිපල් කම්කරුවන් (පල්ලකැලේ සහ කොත්මලේ) | 13 |
| | **එකතුව** | **125** |

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

## සංවිධාන ව්‍යුහය




E:Harshani/Manel/ ORG ST.

# සංවර්ධන වැඩසටහන

<u>2016 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්වලට අදාල එක් එක් ව්‍යාපෘති යටතේ ප්‍රගතිය පහත සඳහන් පරිදිය</u>

## 01. ග්‍රාමීය සංවර්ධන සැලසුම්කරණය

### i. මූලික සංරක්ෂණ සැලසුම්කරණය

2016 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් සඳහා ඉලක්ක ගත කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් හඳුනාගත් ගම්මාන තුල සංවර්ධන වැඩසටහන්වලට සහභාගි කර ගැනීම සඳහා නිශ්චිත වූ ගම්මාන තුල ගොවි ප්‍රජාවගේ සහභාගීත්වයෙන් ක්ෂේත්‍ර මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. ගම්මානය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන සැලසුම හඳුන්වාදීමත් ඉලක්ක ගත කාල රාමුව සකස් කිරීමත් මෙම වැඩසටහනෙහි මූලික අරමුණු වූ අතර 2016 වර්ෂය අවසන් වන විට මෙම වැඩසටහන තුලින් ලබාගත් ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.



ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය දෙල්තොට - 2016-02-02

| වැඩසටහන | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය |
| මූලික සංරක්ෂණ සැලසුම්කරණය | ක්ෂේත්‍ර වැඩසටහන් | 80 | 0.400 | 80 | 0.393 | 100 % | 98 % |
| | සහභාගි වූ සංඛ්‍යාව | 10000 | | 8610 | | 86.1 % | |





ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය දෙල්තොට - 2016-02-02

## ii. ග්‍රාමීය නායකත්ව සංවර්ධනය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරනු ලබන ක්ෂේත්‍ර කළමණාකරුවන්ගේ කටයුතු සඳහා අවශ්‍ය සහායක කණ්ඩායමක් ගොඩනගා ගැනීම පිණිස මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. ගම්මාන තුල ජීවත්වන තරුණ තරුණියන් කණ්ඩායමක් හඳුනා ගෙන ඔවුන් සඳහා ග්‍රාමීය නායකත්වය හා සහභාගීත්ව සංවර්ධනය යන කරුණු පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව ඔවුන් ග්‍රාමීය ප්‍රජා නායකයන් ලෙස සමාජ ගත කරනු ලබයි. 2016 වර්ෂයේ මෙම වැඩසටහන තුලින් අත්කර ගත් ප්‍රගතිය පහත සඳහන් පරිදිය.





ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය - පිළිමතලාව - 2016-04-25

<table>
<tr><th rowspan="2">වැඩසටහන</th><th rowspan="2">ඒකකය</th><th colspan="2">ඉලක්කය</th><th colspan="2">ප්‍රගතිය</th><th colspan="2">ප්‍රතිශතය</th></tr>
<tr><th>භෞතික</th><th>මුල්‍ය රු.මි.</th><th>භෞතික</th><th>මුල්‍ය</th><th>භෞතික</th><th>මුල්‍ය</th></tr>
<tr><td rowspan="2">ග්‍රාමීය නායකත්ව සංවර්ධනය</td><td>පුහුණු වැඩසටහන්</td><td>10</td><td rowspan="2">0.750</td><td>10</td><td rowspan="2">0.664</td><td>100 %</td><td rowspan="2">89 %</td></tr>
<tr><td>ප්‍රජා නායකයින් සංඛ්‍යාව</td><td>400</td><td>400</td><td>100 %</td></tr>
</table>





ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය - පිළිමතලාව - 2016-04-24

## 02. විෂයානු බද්ධ පුහුණු වැඩසටහන

ඉලක්ක ගත ගම්මාන තුල ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත පාංශු සංරක්ෂණ වැඩසටහන පිළිබඳ ගොවි ප්‍රජාව වෙත නව තාක්ෂණය රැගෙන යාම මෙම වැඩසටහනෙහි මුලික අරමුණ වේ. ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන මඟින් පාංශු සංරක්ෂණය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ගොවි ප්‍රජාව වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

ඒ අනුව 2016 වර්ෂයේ මෙම වැඩසටහන තුලින් පහත සඳහන් පරිදි ප්‍රගතිය අත්කර ගෙන ඇත.




ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මල්ලවපිටිය - කටුපිටිය දකුණ ග්‍රාම නිලධාරී වසම

| වැඩසටහන | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මුල්‍ය රු.මි. | භෞතික | මුල්‍ය රු.මි. | භෞතික | මුල්‍ය |
| විෂයානු බද්ධ පුහුණු වැඩසටහන | පුහුණු වැඩසටහන් | 80 | 0.400 | 80 | 0.366 | 100 % | 92 % |
| | සහභාගී වු සංඛ්‍යාව | 10000 | | 8324 | | 83 % | |




ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මල්ලවපිටිය කටුපිටිය දකුණ ග්‍රාම නිලධාරී වසම

## 03. පාංශු සංරක්ෂණය හා දියබෙත්ම කළමණාකරණය

### i. පාංශු සංරක්ෂණ ආදර්ශන ස්ථාපිත කිරීම

විෂයානුබද්ධ තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කිරීම තුලින් ගොවීන් අතරට නව තාක්ෂණය රැගෙන යන අතරම එම සියළුම තාක්ෂණයන් ඒකාබද්ධ කරන ලද ආදර්ශනයක් සකස් කිරීම මගින් ගොවි ප්‍රජාව වඩාත් ප්‍රායෝගික ලෙස දැනුවත් කිරීමට හැකියාව ලැබෙනු ඇත. එම සිද්ධාන්තයන් ඉලක්ක කරගනිමින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම විද්‍යානුකූල පාංශු සංරක්ෂණ ආදර්ශනයක් සකස් කිරීම සඳහා 2016 වර්ෂයේ ඉලක්ක ගත විය. මෙම වැඩසටහන තුලින් අත්කරගත් ප්‍රගතිය හා ආදර්ශන ස්ථාපිත නාම ලේඛනය පහත සඳහන් පරිදිය.



ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : - වැලිමඩ



ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : - යටවත්ත

| වැඩසටහන | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මුල්‍ය රු.මි. | භෞතික | මුල්‍ය රු.මි. | භෞතික | මුල්‍ය |
| පාංශු සංරක්ෂණ ආදර්ශන ස්ථාපිත කිරීම | ආදර්ශන | 50 | 2.0 | 40 | 1.639 | 80 % | 82 % |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේ.කො | අනු අංකය | ආදර්ශනයේ නම |
|---|---|---|---|
| මහනුවර | දෙල්තොට | 1 | සුදුවැල්ල ග්‍රාම නිලධාරි වසම |
| | | 2 | ගලහ ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| | යටිනුවර | 3 | ඒදඩුවාව ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| | අකුරණ | 4 | අලවතුගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| | හාරිස්පත්තුව | 5 | යටිවාවල ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| | පූජාපිටිය | 6 | වැවල ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| | උඩුදුම්බර | 7 | මී තොට හේන ආදර්ශ ගම්මානය |
| | පාතහේවාහැට | 8 | තලාතුඔය ගොවිජන සේවා මධ්‍ය.භූමිය |
| | තෙල්දෙණිය | 9 | මැදමහනුවර ගොවිජන සේවා මධ්‍යස්ථානය |
| | පාතදුම්බර | 10 | විද්‍යා දර්ශන පිරිවෙන - වත්තේගම |
| | | 11 | පශු වෛද්‍ය කාර්යාලය -වත්තේගම |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේ.කො | අනු අංකය | ආදර්ශනයේ නම |
|---|---|---|---|
| මාතලේ | නාවුල | 12 | කෝන්ගහවෙල ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය |
| | යටවත්ත | 13 | යටවත්ත ගොවිජන සේවා භූමිය |
| | විල්ගමුව | 14 | හෙට්ටිපොල ගොවිජන සේවා භූමිය |
| | ලග්ගල පල්ලේගම | 15 | ඉළුක්කුඹුර ගොවිජන සේවා මධ්‍ය.භූමිය |
| | අඹන්ගඟ කොරලය | 16 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය |
| | උකුවෙල | 17 | ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය |
| | මාතලේ | 18 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය |
| | පල්ලෙපොල | 19 | පල්ලේපොල ගොවිජන සේවා භූමිය |
| | රත්තොට | 20 | වේරගම ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය |
| | ගලේවෙල | 21 | වාසලකෝට්ටේ ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය |
| නුවරඑළිය | කොත්මලේ | 22 | මල්දෙණිය ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය |
| | අඹගමුව | 23 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය |
| | හඟුරන්කෙත | 24 | මන්දාරම්නුවර ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය |
| | | 25 | බෝගමුව හරිත උද්‍යාන ගොඩනැගිල්ල සහිත භූමිය |
| | | 26 | රිකිල්ලගස්කඩ ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය |
| කුරුණෑගල | රිදීගම | 27 | දොඩම්ගස්ලන්ද ගොවි ජන සේවා මධ්‍යස්ථාන භූමිය |
| | මල්ලව පිටිය | 28 | කුරු/වේරවැල්ල ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය |
| කෑගල්ල | කෑගල්ල | 29 | පරගම්මන ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය |
| | අරණායක | 30 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය |
| | දෙහිඕවිට | 31 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය |
| | යටියන්තොට | 32 | මල්වත්ත ආයුර්වේද රෝහල් භූමිය |
| බදුල්ල | රිදීමාලියද්ද | 33 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය |
| | ඌවපරණගම | 34 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය |
| | වැලිමඩ | 35 | බොරලන්ද පොලිස් ස්ථානය |
| | මීගහ කිවුල | 36 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය |
| රත්නපුර | කුරුවිට | 37 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමිය |
| | ඇලපාත | 38 | ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය |
| | ඇහැලියගොඩ | 39 | ර/ධර්මපාල විද්‍යාල භූමිය |
| | කිරි ඇල්ල | 40 | ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමිය |

### ii. "සොහා සිසු නැණ පවුර" පාසැල් පාරිසරික වැඩසටහන

පරිසර සංරක්ෂණය ස්වභාවික සම්පත් තිරසාර ලෙස කළමණාකරණය කිරීම, හා ස්වභාවික ආපදා තත්ත්වයන් අවම කිරීම පිළිබඳ පාසැල් දූදරුවන් හට නව දැනුම හා ආකල්ප සංවර්ධනය ඉලක්ක කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. හඳුනාගත් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම එක් පාසලක් මෙම වැඩසටහන සඳහා දායක කර ගනු ලබයි. ඉහත විෂයන් පිළිබඳ න්‍යායාත්මක පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර පාසැල් භූමිය පාංශු සංරක්ෂණ හා පරිසර ආදර්ශනයක් ලෙස සංවර්ධනය කරනු ලබයි. ඒ අනුව 2016 වර්ෂයේ මෙම වැඩසටහන තුලින් අත්කර ගත් ප්‍රගතිය හා මෙම වැඩසටහන ක්‍රියාත්මක කල පාසැල් පහත සඳහන් පරිදිය.

| වැඩසටහන | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය |
| "සොහා සිසු නැණ පවුර" පාසැල් පාරිසරික වැඩසටහන | පාසැල් | 50 | 2.0 | 44 | 1.883 | 88 % | 94 % |
| | සිසුන් | 5000 | | 5350 | | | |



ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : - යටවත්ත



ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : - මාවතගම

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේ.කො | අනු අංකය | පාසලේ නම |
|---|---|---|---|
| මහනුවර | පාතහේවාහැට | 1 | මහ/බොපිටිය රාජසිංහ ජා.පා |
| | දෙල්තොට | 2 | මහ/බොපිටිය දෙමල විද්‍යාල |
| | තෙල්දෙණිය | 3 | මහ/උඩිස්පත්තුව ම. වි |
| | අකුරණ | 4 | මප/කටු/දිප්පිටිය ද්විතීක පාසල |
| | පාතහේවාහැට | 5 | මප/මහ/තලාතුඔය ක.වි |
| | පූජාපිටිය | 6 | මප/කටු/පූජා/කිරිවාන කැටිය ක.වි |
| | යටිනුවර | 7 | මප/දෙනු/කොබ්බෑකඩුව.වි. |
| | හාරිස්පත්තුව | 8 | මප/කටු/ශ්‍රී සුමන තිස්ස ක.වි |
| | පාතදුම්බර | 9 | මප/වත්/වත්තේගම ම.වි. |
| | ගඟවට කෝරලය | 10 | මහ/ශ්‍රී රාහුල විද්‍යාලය |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | අනු අංකය | පාසලේ නම |
|---|---|---|---|
| මාතලේ | නාවුල | 11 | මා/නා/කෝන්ගහවෙල ම.වි |
| | විල්ගමුව | 12 | මප/විල්/නුග ගොල්ල ම. වි |
| | ලග්ගල පල්ලේගම | 13 | මප/විල්/මහල කොටුව ම.වි |
| | රත්තොට | 14 | මා/රත්/වේරගම සිරි සීවලී ම.වි |
| | අඹන්ගඟ කොරලය | 15 | මප/නා/මහින්ද ද්විතීත පාසල |
| | උකුවෙල | 16 | ම/තැන්න මහා විද්‍යාලය |
| | මාතලේ | 17 | මා/අළුවිහාරේ මහා විද්‍යාලය |
| | පල්ලෙපොල | 18 | මප/ග/මිල්වාන මහා විද්‍යාලය |
| | යටවත්ත | 19 | මා/අනගාරික ධර්මපාල ම.වි |
| | දඹුල්ල | 20 | මප/ග/ඇතා බැදි වැව ක.වි |
| | ගලේවෙල | 21 | මප/ග/තලකිරියාගම ම.වි |
| නුවරඑළිය | කොත්මලේ | 22 | මප/කොත්/සිරි සමන් ම. වි |
| | අඹගමුව | 23 | මප/හැ/දෙහිගස්තැන්න වි |
| | වලපනේ | 24 | මප/ව/සිරි සිදුහත් මහා විද්‍යාලය |
| | | 25 | රාගල මන්ත්‍රී තැන්න ම.වි |
| කුරුණෑගල | රිදීගම | 26 | ව/ඉ/රිදී/ ඊරියගොල්ල මහා.වි |
| | මාවතගම | 27 | කු/මීතැන්නවල ම.වි |
| | මල්ලව පිටිය | 28 | කු/කොස්ගොල්ල ක.වි |
| කෑගල්ල | කෑගල්ල | 29 | කෑ/මාබෝපිටිය මහා විද්‍යාලය |
| | අරණායක | 30 | කෑ/මාව/ගම්තුන උඩගම ක.වි |
| | දෙහිඕවිට | 31 | කෑ/දෙහි/රංජන් විජේරත්න වි |
| | යටියන්තොට | 32 | කෑ/දෙහි/ඉහළ ගම්මැද්ද ක.වි |
| | බුලත්කොහුපිටිය | 33 | කෑ/දෙහි/වෑගල්ල ක.වි. |
| බදුල්ල | රිදීමාලියද්ද | 34 | බ/මහමැදගම ම.වි |
| | ඌව පරනගම | 35 | බ/කරගහ උල්පත ශ්‍රී ගුනානන්ද .වි |
| | වැලිමඩ | 36 | බ/බෝගහකුඹුර මහා. වි |
| | මීගහ කිවුල | 37 | බ/බලගොල්ල විද්‍යාලය |
| රත්නපුර | කුරුවිට | 38 | ර/සුදාගල ශ්‍රී රාහුල ම.වි |
| | ඇලපාත | 39 | ර/නිවි/දම්බුළුවන වි |
| | ඇහැලියගොඩ | 40 | ර/මාපොට විද්‍යාලය |
| | කිරි ඇල්ල | 41 | ර/ඇල්ලගාව විද්‍යාලය |
| පොළොන්නරුව | මැදිරිගිරිය | 42 | පො/දිවුලන් කඩවල ම.ම.වි. |
| | | 43 | පො/විජයරාජ ම.වි. |
| | දිඹුලාගල | 44 | පො/දිඹු/විලයාය ම.වි. |

### iii. ජල මුලාශ්‍ර හා දියකඳුරු සංරක්ෂණ වැඩසටහන

පාරිසරික ලෙස සංවේදී ප්‍රදේශවල ඇති ජල මුලාශ්‍ර හා දියකඳුරු අයහපත් මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශවීම දක්නට ඇති සුලභ තත්ත්වයකි. මෙම හේතුව නිසා එම ප්‍රදේශවල ජලමුලාශ්‍ර සිඳී ගොස් ඇති අතර පානීය ජලය සපයා ගැනීම පවා දුෂ්කර තත්ත්වයකට පත්ව ඇත. මෙම තත්ත්වයන් අවම කිරීම සඳහා හඳුණාගත් ජලමුලාශ්‍ර හා දියකඳුරු සංරක්ෂණය කිරීමේ කාලීන වැඩසටහන් 2016 වර්ෂයේ අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන තුලින් ලබාගත් ප්‍රගතිය හා සංරක්ෂිත ස්ථාන පහත සඳහන් පරිදිය.

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඃ - මාවතගම**


ඉදිකිරීමට පෙර


ඉදිකිරීමෙන් පසු

2016-10-17

| වැඩසටහන | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මුල්‍ය රු.මි. | භෞතික | මුල්‍ය රු.මි. | භෞතික | මුල්‍ය |
| ජල මුලාශ්‍ර හා දියකඳුරු සංරක්ෂණ වැඩසටහන | ජල මුලාශ | 40 | 2.0 | 32 | 1.659 | 80 % | 83 % |

| දිස්ත්‍රික්ය | ප්‍රාදේශීය ලේ.කො | අනු අංකය | දිය රක්ෂිතයේ නම |
|---|---|---|---|
| මහනුවර | පාතහේවාහැට | 1 | ශ්‍රියාගම මුරපොල රක්ෂිතය |
| | අකුරණ | 2 | බලකඩුව දියරක්ෂිතය |
| | | 3 | දිප්පිටිය අමුණ දිය රක්ෂිතය |
| | පූජාපිටිය | 4 | වටගොඩතැන්න පිහිල්ල රක්ෂිතය |
| | | 5 | ගුරුවෙල අංග රක්ෂිතය |
| | යටිනුවර | 6 | යටිනුවර දිය රක්ෂිතය |
| | හාරිස්පත්තුව | 7 | බුලත්ගොල්ල පිහිල්ල දි.ර |
| | පාතදුම්බර | 8 | රාස්ඇල්ල ජලමූලාශ්‍රය |


| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේ.කො | අනු අංකය | දිය රක්ෂිතයේ නම |
|---|---|---|---|
| මාතලේ | නාවුල | 9 | ගල්පිහිල්ල උල්පත දිය රක්ෂිතය |
| | විල්ගමුව | 10 | උඩවෙල උල්පත දිය රක්ෂිතය |
| | ලග්ගල පල්ලේගම | 11 | මාඔය බුබුල දිය රක්ෂිතය |
| | රත්තොට | 12 | දඹේ ඔය දිය රක්ෂිතය |
| | අඹන්ගඟ කොරලය | 13 | පුස්සැල්ල නවෝදයා පාසල අසල දිය රක්ෂිතය |
| | උකුවෙල | 14 | එනසල්මඩ ජල රක්ෂිතය |
| | මාතලේ | 15 | කැටවල ජලමූලාශ්‍රය |
| | ගලේවෙල | 16 | දේවහුව ජල රක්ෂිතය |
| නුවරඑළිය | කොත්මලේ | 17 | ඉහල ගොරකඔය ජල උල්පත |
| | අඹගමුව | 18 | දෙහිගස්තැන්න වි.ජ.උ.රක්ෂිතය |
| | හගුරන්කෙත | 19 | මඩුමාන දිය රක්ෂිතය |
| | වලපනේ | 20 | ගල්කඩවෙල දිය රක්ෂිතය |
| කුරුණෑගල | රිදීගම | 21 | නාගස්පිටිය දිය උල්පත රක්ෂිතය |
| | මාවතගම | 22 | දුනුකේවත්ත පොල්ගහමුල දි.ර |
| | මල්ලව පිටිය | 23 | රොක්කේ වත්ත දි.ර |
| කෑගල්ල | කෑගල්ල | 24 | හීනා කඳුර ඇල රක්ෂිතය |
| | අරණායක | 25 | වැලිකඩ ඇල දිය රක්ෂිතය |
| | යටියන්තොට | 26 | මත්තමගොඩ දියරක්ෂිතය |
| බදුල්ල | ඌව පරනගම | 27 | මාගල්හේන දිය රක්ෂිතය |
| | වැලිමඩ | 28 | රහන්ගල පොළඟා උල්පත දි.ර |
| රත්නපුර | කුරුවිට | 29 | බරු ඇල රක්ෂිතය |
| | ඇලපාත | 30 | කොඳමල් දොල රක්ෂිතය |
| | ඇහැලියගොඩ | 31 | හේන්දොල රක්ෂිතය |
| | කිරි ඇල්ල | 32 | කැටගොඩැල්ල රක්ෂිතය |

### iv. පාංශු සංරක්ෂණ වැඩසටහන

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් අතරින් ප්‍රමුඛතම සංවර්ධන වැඩසටහනක් ලෙස හඳුනාගෙන ඇති මෙම වැඩසටහන සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුලින් වෙන් කරන ලද මුදල රු.මි. 60 කි. පාංශු සංරක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා ඉලක්ක ගතවූ ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර 3000 කි. මෙම ඉඩම් ප්‍රමාණය ප්‍රජාවගේද සහභාගීත්වය තුල විධිමත් සංරක්ෂණ ක්‍රම යොදා සංරක්ෂණය කිරීමට යෝජිත වූ අතර ඒ අනුව මෙම වැඩසටහන තුලින් අත්කර ගත් ප්‍රගතිය පහත සඳහන් පරිදිය.

| වැඩසටහන | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය |
| පාංශු සංරක්ෂණ වැඩසටහන | හෙක්ටයාර | 3000 | 60.0 | 2745 | 54.9 | 91 % | 91 % |
| | ගොවීන් සංඛ්‍යාව | 8610 | | 7863 | | 91 % | |









## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පාංශු සංරක්ෂණ කටයුතු

| අනු අංකය | කලාපය | අනු අංකය | ප්‍රාදේශීය ලේ.කො | ඉලක්කය (හෙක්.) | පාංශු සංරක්ෂණ ගෙවීම් | |
|---|---|---|---|---|---|---|
| | | | | | හෙක් | මුදල රු. |
| 1 | මහනුවර | 1 | දෙල්තොට | 75 | 55.84 | 1,116,725.00 |
| | | 2 | පූජාපිටිය | 75 | 93.72 | 1,874,450.00 |
| | | 3 | අකුරණ | 75 | 42.27 | 845,450.00 |
| | | 4 | යටිනුවර | 75 | 93.09 | 1,861,700.00 |
| | | 5 | හාරිස්පත්තුව | 75 | 47.99 | 959,800.00 |
| | | 6 | පාතහේවාහැට | 75 | 53.82 | 1,076,350.00 |
| | | 7 | තෙල්දෙණිය | 75 | 47.95 | 959,000.00 |
| | | 8 | උඩුදුම්බර | 75 | 121.05 | 2,421,000.00 |
| | | 9 | පාතදුම්බර | 75 | 73.49 | 1,469,720.00 |
| 2 | මාතලේ | 10 | නාවුල | 75 | 51.5 | 1,030,000.00 |
| | | 11 | යටවත්ත | 75 | 45.76 | 915,200.00 |
| | | 12 | විල්ගමුව | 75 | 70.5 | 1,410,000.00 |
| | | 13 | ලග්ගල පල්ලේගම | 75 | 17.2 | 344,000.00 |
| | | 14 | උකුවෙල | 75 | 75.32 | 1,506,350.00 |
| | | 15 | මාතලේ | 75 | 56.07 | 1,121,320.00 |
| | | 16 | පල්ලෙපොල | 75 | 36.7 | 734,000.00 |
| | | 17 | ගලේවෙල | 75 | 120 | 2,400,000.00 |
| | | 18 | දඹුල්ල | 75 | 74.8 | 1,496,000.00 |
| | | 19 | අඹන්ගඟ කොරලය | 75 | 70.99 | 1,419,800.00 |
| | | 20 | රත්තොට | 75 | 50.68 | 1,013,600.00 |
| 3 | නුවරඑළිය | 21 | කොත්මලේ | 75 | 131.99 | 2,639,800.00 |
| | | 22 | අඹගමුව | 75 | 52.10 | 1,042,000.00 |
| | | 23 | හඟුරන්කෙත | 75 | 28.30 | 566,000.00 |
| | | 24 | වලපනේ | 75 | 45.20 | 904,000.00 |
| 4 | කුරුණෑගල | 25 | රිදීගම | 75 | 93.4 | 1,868,000.00 |
| | | 26 | මාවතගම | 75 | 104.1 | 2,082,000.00 |
| | | 27 | මල්ලව පිටිය | 75 | 37 | 740,000.00 |
| 5 | කෑගල්ල | 28 | අරණායක | 75 | 72.2 | 1,444,000.00 |
| | | 29 | බුලත්කොහුපිටිය | 75 | 70.4 | 1,408,000.00 |
| | | 30 | දෙහිඕවිට | 75 | 69.4 | 1,388,000.00 |
| | | 31 | කෑගල්ල | 75 | 72.3 | 1,446,000.00 |
| | | 32 | යටියන්තොට | 75 | 80.8 | 1,616,000.00 |
| 6 | බදුල්ල | 33 | ඌව පරනගම | 75 | 33.7 | 674,000.00 |
| | | 34 | වැලිමඩ | 75 | 45.3 | 906,000.00 |
| | | 35 | රිදීමාලියද්ද | 75 | 128.8 | 2,576,000.00 |
| | | 36 | මීගහකිවුල | 75 | 43.7 | 874,000.00 |
| 7 | රත්නපුර | 37 | කුරුවිට | 75 | 83.1 | 1,662,000.00 |
| | | 38 | ඇලපාත | 75 | 87.8 | 1,756,000.00 |
| | | 39 | ඇහැලියගොඩ | 75 | 76.70 | 1,534,000.00 |
| | | 40 | කිරි ඇල්ල | 75 | 90.4 | 1,808,000.00 |
| | | | **එකතුව** | | **2745.41** | **54,908,265.00** |

## 04. සැලසුම්කරණය හා ප්‍රගති සමාලෝචනය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සියළුම සංවර්ධන වැඩසටහන් පිළිබඳව ආයතනයේ මාණ්ඩලික නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් සෑම මසකම ප්‍රගති සමාලෝචන රැස්වීමක් සංවිධානය කරනු ලබයි. මෙම වැඩසටහනේ ප්‍රගතිය පහත සඳහන් පරිදිය.

| වැඩසටහන | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය |
| ප්‍රගති සමාලෝචනය | රැස්වීම් | 12 | 0.150 | 13 | 0.0961 | 108 % | 64 % |

## 05. මානව හා භෞතික සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ ඉලක්කගත සංවර්ධන වැඩසටහන් වඩාත් ඵලදායි හා කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා ආයතනයේ මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම කාලීන අවශ්‍යතාවයක් ලෙස සලකා පහත සඳහන් ක්‍රියාකාරකම් 2016 වර්ෂයේ ඉලක්ක ගත සංවර්ධන වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලදි.

| වැඩසටහන | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය |
| මානව සම්පත් සංවර්ධනය | පුහුණු වැඩසටහන් | 10 | 0.750 | 05 | 0.291 | 50 % | 39 % |
| භෞතික සම්පත් සංවර්ධනය | | | 1.845 | | 1.842 | | |

ඒ අනුව 2016 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන වර්ෂය සඳහා ශ්‍රී ලංකා හදබිම අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලබාදෙන ලද රු.මි. 70.0 මුදලින් රු.මි. 63.65 ක මුදලක් වැය කර ඇත.

# අලෙවි අංශය

# පාරිභෝගික සේවාව

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව ක්ෂේත්‍රයෙන් බිහිවූ ගොවි සංවිධාන වලින් ලබාගන්නා අස්වැන්න පසුඅස්වනු හානිය අවම කරමින් ආරක්ෂිත ඇසුරුම් වල බහා රැගෙන එනු ලබයි. එම කෘෂි ද්‍රව්‍ය මිලදී ගැනීමට පෙර නැවත තත්ත්ව පරික්ෂාවකට ලක්කර නැවුම් සහ ගුණාත්මයෙන් සපිරි කෘෂි ද්‍රව්‍ය මිලදී ගැනීම සිදුකරනු ලබයි. එම කෘෂි ද්‍රව්‍ය සහනදායි මිලට අලවි කිරීම සිදු කරන අතර සම්ප්‍රදායක ආහාර හඳුන්වා දීමක් සිදුවන අතරම ප්‍රචලිත විමක්ද සිදුවේ. අලවියෙන් පසු ඉතිරිවන කෘෂි ද්‍රව්‍ය හදබිම ගොවිපොළවල් වලට කොම්පෝස්ට් පොහොර සඳහාද, විශ්ව විද්‍යාලයේ ගොවිපල වල සත්ව ආහාර සඳහාද නිකුත් කරනු ලබන්නේ අපතේ යාම ආර්ථිකයට ඵලදායි ලෙස යොදා ගැනීම සඳහායි. මෙම සියලු කාර්ය රාජ්‍ය ආයතනයකින් ඉටුවිය යුතු වගකීම උපරිම ලෙස ඉටුකිරීම සඳහා සේවා පරිසරයක් තුල සුහදශීලි පාරිභෝගික සත්කාරයක් සහිතව පවත්වාගෙන යනු ලබන්නේ අප අලෙවි ව්‍යාපෘතියේ මූලික අරමුණු ඉටුවන ආකාරයෙනි.

## අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතියේ අරමුණු

1. වස විසෙන් තොර කෘෂි නිෂ්පාදන ඉහල නැංවීමට ගොවි ප්‍රජාව පෙලඹවීම
2. ග්‍රාමීය කෘෂි නිෂ්පාදන සඳහා ගොවියාට ඉහල මිලක් ලබා දීම.
3. නාගරික පාරිභෝගිකයාට උසස් ප්‍රමිතියකින් යුත් කෘෂි නිෂ්පාදන සැපයීම හා සම්ප්‍රදායික ආහාර නිෂ්පාදන ප්‍රචලිත කිරීමට කටයුතු යෙදීම.
4. පසු අස්වනු හානි  අවම කිරීමට කටයුතු දීම .
5. ග්‍රාමීය තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබාදීම.

## 2016 වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්

### සැපයුම් ද්‍රව්‍ය අනුව

| වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| 01. එළවළු සැපයුම | 123 |
| 02. පැළ සැපයුම | 26 |
| 03. සැකසු කෘෂි ද්‍රව්‍ය, බෝතල්, පැකට් සහ ඇසුරු අයිතම | 107 |
| 04. මුළු සැපයුම්කරුවන් සංඛ්‍යාව | 256 |

### සේවා නියුක්තිය සහ සේවා සුරක්ෂිතතාවය

- අනුමත සේවක මණ්ඩලය - 35

අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතියට අදාලව 2016 වසර වන විට සෘජු සේවා නියුක්තිය 29 දෙනෙකි. ඊට අමතරව විශාල ප්‍රමාණයේ වක්‍ර ශ්‍රම දායකත්වයක්ද ඇත. ඉන් දැනට සෘජු සේවා නියුක්තිකයන්ගේ සේවා සුරක්ෂිතතාවය සඳහා පහත පරිදි සේවක සුභසාධනය නගාසිටුවීමට කටයුතු කර ඇත.

### සේවක සුභසාධනය

### 01. සංචිත වෙන් කිරීම

- හදබිම අලෙවි කාර්ය මණ්ඩලයේ අවධානම් සංචිත අරමුදල - රු. 2,187,562.17
- අලෙවි කාර්ය මණ්ඩලයේ සුභ සාධක සේවා - රු. 469,457.65

### 02. සේවක ණය ලබාදීම

### අලෙවි කාර්ය මණ්ඩලය සඳහා


- ආපදා ණය - 130,000.00
- ක්ෂණික ණය - 75,000.00
- අලෙවි කාර්ය මණ්ඩලය සඳහා ඔවුන් ලබන මුලික වැටුප මෙන් 3 ගුණයක මුදලක් ලබාදී ඇත - (මුලික වැටුප x 3)
- අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයට ණය ලබාදීම සඳහා - 232,432.29
  ලබාදුන් චක්‍රීය අරමුදල - මිලියන 100

### ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා

- අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතිය මඟින් දෛනික වෙන් කරන කුලිය පදනම්ව ආරම්භ කර ඇති සංචිත අරමුදලින් මාස 10 ක් ආපදා ණය මුදල ලබාදීම
- අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතියේ සංචිත මඟින් රු.මිලියන 10 ක චක්‍රීය අරමුදලක් ආරම්භ කර රු. 250,000.00 ක විශේෂ ණය මුදලක් ලබාදීම.

**ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන**
**2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ප්‍රගතිය**

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | එකතුව රු |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| විකුණුම් රු | 63,416,558.06 | 70,622,665.94 | 83,415,551.96 | 96,996,133.59 | 107,095,443.68 | 114,893,408.11 | 118,235,748.11 | 122,593,471.58 | 105,044,180.48 | 882,313,161.51 |
| ගැණුම් රු | 53,810,289.99 | 56,678,093.44 | 69,167,508.44 | 78,181,732.99 | 85,691,731.78 | 95,139,121.96 | 94,094,532.32 | 100,117,666.64 | 86,619,077.09 | 719,499,754.65 |
| දළ ලාභය | 10,041,173.87 | 12,580,209.98 | 14,151,150.08 | 18,286,846.96 | 21,682,690.25 | 21,307,054.35 | 24,096,107.32 | 24,004,839.29 | 23,562,475.13 | 169,712,547.23 |
| දළ ලාභ ප්‍රතිශතය | 15.83 | 17.81 | 16.96 | 18.85 | 20.25 | 18.55 | 20.38 | | | 128.64 |
| වියදම | 10,048,684.85 | 11,121,577.18 | 12,487,941.28 | 13,562,209.56 | 14,296,392.46 | 18,588,692.42 | 25,995,036.36 | 22,153,443.46 | 19,191,169.12 | 147,445,146.69 |
| ශුද්ධ ලාභය | 4,873,631.00 | 1,518,032.80 | 1,792,711.80 | 5,106,858.41 | 8,100,955.18 | 4,984,331.29 | 1,662,788.48 | 3,229,691.03 | 5,811,112.28 | 37,080,112.27 |


අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය
140,000,000
120,000,000
100,000,000
80,000,000
60,000,000
40,000,000
20,000,000
-
2008
2009
2010
2011
2012
2013
2014
2015
2016
විකුණුම් රු
ගැණුම් රු
දළ ලාභය
වියදම
ශුද්ධ ලාභය

## ශ්‍රී ලංකා හදබිම අධිකාරිය - අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතිය

### පසුගිය වසර 03 ක මූල්‍ය ප්‍රගතිය

| වත්කම් | වර්ෂය | | |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | 2014 | 2015 | 2016 |
| ස්ථාවර වත්කම් | 9,746,811.22 | 8,609,974.84 | 9,279,867.00 |
| එකතුව | 9,748,825.22 | 8,611,989.84 | 9,281,883.00 |
| ජංගම වත්කම් | | | |
| තොගය | 1,971,066.67 | 1,529,034.35 | 1,137,371.74 |
| වෙළඳ ණයගැතියෝ | 3,545,275.60 | 10,078,390.57 | 14,885,053.57 |
| ස්ථාවර තැම්පතු | 13,707,471.54 | 3,333,787.20 | 6,840,045.36 |
| ආරක්ෂක ඇප තැම්පතු | 21,385.61 | 24,756.65 | 22,256.65 |
| ඉතිරි කිරීමේ ගිණුම් | 232,432.29 | 1,296,358.90 | 856,519.00 |
| මුදල් ශේෂය | (1,971,006.80) | 5,340,947.63 | 3,821,790.24 |
| එකතුව | 17,506,624.91 | 21,603,275.30 | 27,563,036.56 |
| වත්කම් මුළු එකතුව | 27,255,450.13 | 30,215,265.14 | 36,844,919.56 |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | | | |
| වෙළඳ ණයහිමියෝ | 947,373.55 | 1,901,398.69 | 3,565,153.87 |
| උපචිත ගෙවීම් | 2,538,761.35 | 1,308,552.18 | 999,031.93 |
| ආරක්ෂක ඇප තැම්පතු | 21,385.61 | 24,756.65 | 22,256.65 |
| එකතුව | 3,507,520.51 | 3,234,707.52 | 4,586,442.45 |
| ජංගම නොවන වගකීම් | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | 714,249.50 | 974,614.00 | 1,363,715.00 |
| ජංගම නොවන වගකීම් වල එකතුව | 714,249.50 | 974,614.00 | 1,363,715.00 |
| වගකීම් වල මුළු එකතුව | 4,221,770.01 | 4,209,321.52 | 5,950,157.45 |
| ශුද්ධ වත්කම් | 23,033,680.12 | 26,005,943.62 | 30,894,762.11 |

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය - අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතිය

පසුගිය වසර 03 ක මෙහෙයුම් ප්‍රතිඵලය

| අනු අංකය | විස්තරය | වර්ෂය | | |
|---|---|---|---|---|
| | | 2014 | 2015 | 2016 |
| 1 | විකුණුම් රු | 114,322,537.68 | 119,333,201.27 | 103,453,770.20 |
| 2 | ගැණුම් රු | 91,208,522.14 | 97,628,339.33 | 79,697,951.93 |
| 3 | දළ ලාභය | 23,069,003.74 | 23,190,382.29 | 23,562,475.13 |
| 4 | වියදම - පුද්ගල පඩිනඩි | 8,418,490.18 | 9,456,499.63 | 10,257,769.11 |
| | - ගමන් වියදම් | 399,318.06 | 290,592.76 | 79,415.00 |
| | - සේවා සැපයීමේ වියදම | 2,764,936.57 | 1,398,168.24 | 528,032.25 |
| | - නඩත්තු වියදම | 3,696,763.10 | 4,472,457.04 | 4,811,711.05 |
| | - වෙනත් වියදම් | 10,715,528.45 | 3,219,709.26 | 3,514,181.71 |
| 5 | ශුද්ධ ලාභය | 1,662,788.48 | 3,229,691.03 | 5,811,112.28 |

# මූල්‍ය වාර්තා

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

2016-12-31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| 2015 | | | | සටහන් | 2016 | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | අලෙවි අංශය | හදබිම අධිකාරිය | වත්කම් | | ප්‍රධාන කාර්යාලය | අලෙවි අංශය | හදබිම අධිකාරිය |
| | | | ජංගම නොවන වත්කම | | | | |
| 62,703,779.56 | 8,609,974.84 | 71,313,754.40 | දේපල පිරියත හා උපකරණ | Note 01 | 47,330,391.15 | 9,279,867.00 | 56,610,258.15 |
| 62,703,779.56 | 8,609,974.84 | 71,313,754.40 | ජංගම නොවන වත්කම් මුළු එකතුව | | 47,330,391.15 | 9,279,867.00 | 56,610,258.15 |
| | | | ජංගම වත්කම් | | | | |
| 7,752,318.25 | 1,529,034.35 | 9,281,352.60 | ඉන්වෙන්ටරිය / තොග | Note 02 | 5,650,752.73 | 1,137,371.74 | 6,788,124.47 |
| 16,729,541.48 | 10,078,390.57 | 26,807,932.05 | වෙළඳ සහ වෙනත් අය විය යුතු දෑ | Note 03 | 23,267,143.57 | 14,885,053.57 | 38,152,197.14 |
| 7,000.00 | - | 7,000.00 | කලින් ගෙවීම් | Note 04 | 7,000.00 | - | 7,000.00 |
| 8,000,000.00 | 3,333,787.20 | 11,333,787.20 | ස්ථාවර තැන්පතු | Note 05 | 2,000,000.00 | 6,840,045.36 | 8,840,045.36 |
| 162,784.49 | 24,756.65 | 187,541.14 | ආරක්ෂක තැන්පතු | Note 06 | 193,430.50 | 22,256.65 | 215,687.15 |
| - | 1,296,358.90 | 1,296,358.90 | ඉතුරුම් ගිණුම් | | - | 856,519.09 | 856,519.09 |
| 6,722,370.69 | 5,340,947.63 | 12,063,318.32 | බැංකු ගිණුම් | Note 07 | 6,233,775.03 | 3,821,790.24 | 10,055,565.27 |
| 39,374,014.91 | 21,603,275.30 | 60,977,290.21 | ජංගම වත්කම් එකතුව | | 37,352,101.83 | 27,563,036.65 | 64,915,138.48 |
| **102,077,794.47** | **30,213,250.14** | **132,291,044.61** | වත්කම් එකතුව | | **84,682,492.98** | **36,842,903.65** | **121,525,396.63** |
| | | | බැරකම් | | | | |
| | | | ජංගම බැරකම් | | | | |
| 8,989,927.79 | 1,901,398.69 | 10,891,326.48 | වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | Note 08 | 11,599,445.08 | 3,565,153.87 | 15,164,598.95 |
| 3,094,270.27 | 1,308,552.18 | 4,402,822.45 | උපචිත වියදම් | Note 09 | 1,266,547.01 | 999,031.93 | 2,265,578.94 |
| 162,784.49 | 24,756.65 | 187,541.14 | ආරක්ෂක තැන්පතු | | 193,430.50 | 22,256.65 | 215,687.15 |
| 12,246,982.55 | 3,234,707.52 | 15,481,690.07 | ජංගම බැරකම් එකතුව | | 13,059,422.59 | 4,586,442.45 | 17,645,865.04 |
| | | | ජංගම නොවන බැරකම් | | | | |
| 15,463,119.98 | 974,614.00 | 16,437,733.98 | පාරිතෝෂික සඳහා වෙන්කිරීම | Note 10 | 16,616,021.00 | 1,363,715.00 | 17,979,736.00 |
| 938,608.97 | - | 938,608.97 | වාහන ණය | | 623,608.97 | - | 623,608.97 |
| 16,401,728.95 | 974,614.00 | 17,376,342.95 | ජංගම නොවන බැරකම් එකතුව | | 17,239,629.97 | 1,363,715.00 | 18,603,344.97 |
| 28,648,711.50 | 4,209,321.52 | 32,858,033.02 | බැරකම් එකතුව | | 30,299,052.56 | 5,950,157.45 | 36,249,210.01 |
| **73,429,082.97** | **26,003,928.62** | **99,433,011.59** | ශුද්ධ වත්කම් එකතුව | | **54,383,440.42** | **30,892,746.20** | **85,276,186.62** |
| | | | ශුද්ධ වත්කම් /සම කොටස් | | | | |
| 43,915,403.58 | - | 43,915,403.58 | රාජ්‍ය ප්‍රදාන ගිණුම | | 28,513,649.32 | - | 28,513,649.32 |
| 992,091.51 | - | 992,091.51 | සංචිත ගිණුම | | 992,091.51 | - | 992,091.51 |
| 1,087,229.82 | - | 1,087,229.82 | ප්‍රාග්ධන සංචිත | | 1,087,229.82 | - | 1,087,229.82 |
| 2,091.97 | - | 2,091.97 | GTZ ප්‍රදාන | | 2,091.97 | - | 2,091.97 |
| 19,334,720.59 | - | 19,334,720.59 | ප්‍රත්‍යාගණන ගිණුම | | 19,334,720.59 | - | 19,334,720.59 |
| 8,097,545.50 | 26,003,928.62 | 34,101,474.12 | අතිරික්ත හිඟය | | 4,453,657.21 | 30,892,746.20 | 35,346,403.41 |
| | | | | | - | | 0.00 |
| **73,429,082.97** | **26,003,928.62** | **99,433,011.59** | ශුද්ධ වත්කම් /සම කොටස් එකතුව | | **54,383,440.42** | **30,892,746.20** | **85,276,186.62** |

පිටු අංක 02 හි ගිණුම්කරන ප්‍රතිපත්ති හා පිටු අංක 17 සිට 44 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණ වල අවශ්‍ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.මෙම මූල්‍ය ප්‍රකාශණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඊට සාක්ෂි වශයෙන් පහත අත්සන් කරන ලදී.

.................................... .................................... 

A.M.W.B.තිලකරත්න — සහකාර අධ්‍යක්ෂ(මුදල්)

කේ.එස් ප්‍රේමචන්ද්‍ර — විධායක අධ්‍යක්ෂ

නන්දසේන හේරත් — සභාපති

සකස් කලේ:-........................................................

පරීක්ෂා කලෙ:-.

# ගිණුම් පිළිබඳ සටහන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති කොමිටිය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති(SLPSAS) වලට අනුව ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කරන ලදී.

හදබිම අධිකාරියේ මුදල් වර්ෂය දෙසැම්බර් 31 වන දායින් අවසන් වන ලිත් වර්ෂය වේ.

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මහා භාණ්ඩාගාරයෙන් මූල්‍ය ප්‍රදාන ලබන අතර එය එහි අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතියෙන් හා ගොවිපල් දෙකකින් ද ( කොත්මලේ හා පල්ලෙකැලේ ) ස්වකීය ආදායම් උපදවා ගනී.

01. ක්ෂය වීම, සියලු වාහන, ගෘහ භාණ්ඩ හා සවි කිරීම්, කාර්යාලීය උපකරණ හා ගොඩනැගිලි වල පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය මත පදනම්ව සරල රේඛීය ක්‍රමයට ගණනය කරන ලදී.

| | |
|---|---|
| වාහන | - 25% වාර්ෂික |
| කාර්යාලීය උපකරණ | - 10% වාර්ෂික |
| ගොඩනැගිලි | - 2. 5% වාර්ෂික |
| ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | - 7.5% වාර්ෂික |
| කෘෂිකාර්මික උපකරණ | - 10%වාර්ෂික |
| මෝටර් සයිකල් | - 20% වාර්ෂික |

වර්ෂය තුළ කරන ලද මිල දී ගැනීම් සඳහා ක්ෂය වීම නොකරන ලද නමුත් ඉවත් කරන ලද වර්ෂය සඳහා මෙන්ම මුළු වර්ෂය සඳහා ක්ෂය වීම කරන ලදී. ඉවත් කරන ලද වර්ෂය තුළ හා මිගදී ගන්නා වර්ෂය තුල මෝටර් සයිකල් සඳහා ක්‍රමක් ක්ෂය කිරීම සිදු කරන ලදී.

02. අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන ගම්පොල නිවාස ණය.

03. මූල්‍ය තත්ව ප්‍රකාශණය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශණය, ශුද්ධ වත්කම් / ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශණය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශණය SLPSAS 01 වලට අනුකුල ය.

04. මුදල් ප්‍රවාහ ප්‍රකාශණය **SLPSAS 02** වලට අනුකුල ය.

05. චක්‍ර ලේඛ අංක 150 ට අනුව කාලානුරූප නොවන වාහන බැහැර කිරීමෙන් ලද ආදායම් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කෙරේ.

06. 2012 වර්ෂය දක්වා අප අගය අඩු කිරීමේ මූලධන ක්‍රමය අනුගමනය කළ අතර අපගේ අගය අඩු කිරීමේ ප්‍රතිපත්තිය 2013 වර්ෂයේ සිට පුනරාවර්තන ක්‍රමයට වෙනස් කර ඇත.

2014 හා 2015 මූල්‍ය වර්ෂ වල අලෙවි ව්‍යාපෘතියේ වංචාවක් අනාවරණය වී ඇති අතර වංචාවට අදාළ මුදල් ප්‍රමාණය මෙතෙක් ගණනය කර නැත.වංචාවට අදාළ නීතිමය කටයුතු අධිකරණයේ සිදු කෙරෙමින් පවතී.

## ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

### 2016. 12. 31. දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය

| 2015 | | | | උපලේඛන | 2016 | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | අලෙවි අංශය | හදබිම අධිකාරිය | | | ප්‍රධාන කාර්යාලය | අලෙවි අංශය | හදබිම අධිකාරිය |
| 57,360,830.16 | - | 57,360,830.16 | මහා භාණ්ඩාගාර අරමුදල - ( පුනරාවර්තන ) | 01 | 59,000,250.57 | | 59,000,250.57 |
| 35,625,000.00 | - | 35,625,000.00 | අමාත්‍යංශ අරමුදල් - විශේෂ | | 58,861,749.43 | | 58,861,749.43 |
| 3,706,537.66 | 1,378,295.20 | 5,084,832.86 | වෙනත් ආදායම් | 02 | 2,982,161.19 | 1,439,806.27 | 4,421,967.46 |
| 8,517,773.35 | - | 8,517,773.35 | ක්ෂය වීම | | 14,834,673.26 | | 14,834,673.26 |
| 0.00 | 24,004,839.29 | 24,004,839.29 | දළ ලාභය | 03 | | 23,562,475.13 | 23,562,475.13 |
| 105,210,141.17 | 25,383,134.49 | 130,593,275.66 | | | 135,678,834.45 | 25,002,281.40 | 160,681,115.85 |
| | | | අඩු කිරීම් :- වියදම් | | | | |
| 44,782,741.85 | 9,456,499.63 | 54,239,241.48 | 01. පුද්ගල පඩිනඩි | 04 | 46,993,527.67 | 10,257,769.11 | 57,251,296.78 |
| 1,691,261.09 | 290,592.76 | 1,981,853.85 | 02. ගමන් වියදම් හා යැපීම් දීමනා | | 1,813,251.50 | 79,415.00 | 1,892,666.50 |
| 4,335,663.59 | 1,398,168.24 | 5,733,831.83 | 03. සැපයුම්කරුවන් / ප්‍රවාහනය | | 4,141,884.60 | 528,032.25 | 4,669,916.85 |
| 6,459,677.21 | 4,472,457.04 | 10,932,134.25 | 04. නඩත්තු වියදම් | | 7,425,392.12 | 4,811,771.05 | 12,237,163.17 |
| 871,971.22 | 1,585,309.77 | 2,457,280.99 | 05. වෙනත් | | 1,345,078.74 | 691,820.92 | 2,036,899.66 |
| 8,517,773.35 | 1,634,399.49 | 10,152,172.84 | 06. ක්ෂය විම | | 14,834,673.26 | 620,558.62 | 15,455,231.88 |
| 40,627,092.12 | | 40,627,092.12 | 07. සංවර්ධන වියදම් | 05 | 63,238,292.85 | - | 63,238,292.85 |
| 355,544.00 | | 355,544.00 | 10. ක්‍රමක්ෂය | | 338,044.00 | - | 338,044.00 |
| | 3,316,016.53 | 3,316,016.53 | 11. අපතය | | | 2,201,802.17 | 2,201,802.17 |
| 107,641,724.43 | 22,153,443.46 | 129,795,167.89 | මෙහෙයුම් වියදම් එකතුව | | 140,130,144.74 | 19,191,169.12 | 159,321,313.86 |
| | | | | | | | |
| (2,431,583.26) | 3,229,691.03 | 798,107.77 | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය /( හිඟය ) | | (4,451,310.29) | 5,811,112.28 | 1,359,801.99 |
| 10,529,128.76 | 22,774,237.59 | 33,303,366.35 | 2016. 01. 01 දිනට ඉදිරියට ගෙනා ශේෂය | | 8,904,967.50 | 25,081,633.92 | 33,986,601.42 |
| **8,097,545.50** | **26,003,928.62** | **34,101,474.12** | කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය / ( හිඟය ) | | **4,453,657.21** | **30,892,746.20** | **35,346,403.41** |
| | | | | | | | |

# දේපල පිරියත හා උපකරණ

පිරිවැය

| ගිණුම් කේතය | විස්තරය | 2016. 01. 01. දිනට පිරිවැය | එකතු කිරීම් | බැහැර කිරීම් | 2016. 12. 31. දිනට පිරිවැය |
|---|---|---|---|---|---|
| | | | මිලදී ගැනීම් | වත්කම් විකිණීම් | |
| 2105 | ගාඩනැගිලි | 15,323,136.91 | 53,500.00 | 0.00 | **15,376,636.91** |
| 2104 | මෝටර් රථ | 53,387,560.00 | | 0.00 | **53,387,560.00** |
| | මෝටර් සයිකල් (ණය) | 1,777,720.00 | 0.00 | 87,500.00 | **1,690,220.00** |
| | උප එකතුව | **55,165,280.00** | **0.00** | **87,500.00** | **55,077,780.00** |
| 2101 | කාර්යාල උපකරණ | 8,794,669.14 | 753,321.50 | 357,339.25 | **9,190,651.39** |
| 2101 | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | 2,302,943.31 | 404,797.50 | 24,316.00 | **2,683,424.81** |
| 2103 | කෘෂිකාර්මික උපකරණ | 6,336,602.50 | 0.00 | 1,778,700.00 | **4,557,902.50** |
| | එකතුව | **87,922,631.86** | **1,211,619.00** | **2,247,855.25** | **86,886,395.61** |

| ගිණුම් කේතය | විස්තරය | 2016. 01. 01. දිනට ශේෂය | වර්ෂය සඳහා අගය අඩු වීම | බැහැර කිරීම සඳහා අගය අඩු වීමේ / හිලව් කිරීමේ ප්‍රතිපාදන | සමුච්චිත ක්ෂය වෙන්කිරීම |
|---|---|---|---|---|---|
| 2105 | ගාඩනැගිලි | 1,377,379.74 | 383,078.38 | 0.00 | 1,760,458.12 |
| 2104 | මෝටර් රථ | 15,087,409.00 | 12,981,165.00 | 0.00 | 28,068,574.00 |
| | මෝටර් සයිකල් (ණය) | 1,247,176.00 | 338,044.00 | 52,500.00 | 1,532,720.00 |
| 2101 | කාර්යාල උපකරණ | 4,288,211.69 | 843,732.98 | 68,467.84 | 5,063,476.83 |
| 2101 | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | 844,074.62 | 170,906.65 | 3,117.26 | 1,011,864.01 |
| 2103 | කෘෂිකාර්මික උපකරණ | 2,374,601.25 | 455,790.25 | 711,480.00 | 2,118,911.50 |
| | එකතුව | **25,218,852.30** | **15,172,717.26** | **835,565.10** | **39,556,004.46** |

ලියා හළ අගය

| ගිණුම් කේතය | විස්තරය | ලියා හළ අගය .2016.12.31 |
|---|---|---|
| 2105 | ගාඩනැගිලි | 13,616,178.79 |
| 2104 | මෝටර් රථ | 25,318,986.00 |
| | මෝටර් සයිකල් (ණය) | 157,500.00 |
| 2101 | කාර්යාල උපකරණ | 4,127,174.56 |
| 2101 | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | 1,671,560.80 |
| 2103 | කෘෂිකාර්මික උපකරණ | 2,438,991.00 |
| | එකතුව | **47,330,391.15** |

# දේපල පිරියත හා උපකරණ

පිරිවැය

| ගිණුම් කේතය | විස්තරය | 2016. 01. 01. දිනට පිරිවැයකදිළු | එකතු කිරීම් | බැහැර කිරීම් | 2016. 12. 31. දිනට පිරිවැය |
|---|---|---|---|---|---|
| 2105 | ගාඩනැගිලි | 3,794,900.79 | 506,916.77 | 0.00 | **4,301,817.56** |
| 2104 | මෝටර් රථ | 4,216,800.00 | 0.00 | 0.00 | **4,216,800.00** |
| 2101 | කාර්යාල උපකරණ | 3,663,012.24 | 428,551.51 | 43,850.00 | **4,047,713.75** |
| 2101 | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් ප්‍රධාන කාර්යාලය | 2,120,831.71 | 376,457.50 | 0.00 | **2,497,289.21** |
| | අම්පාර | 4,300.00 | | | **4,300.00** |
| | එකතුව | **13,799,844.74** | **1,311,925.78** | **43,850.00** | **15,067,920.52** |

| ගිණුම් කේතය | විස්තරය | 2016. 01. 01. දිනට ශේෂය | වර්ෂය සඳහා අගය අඩු වීම | බැහැර කිරීම සඳහා අගය අඩු වීමේ / හිලව් කිරීමේ ප්‍රතිපාදන | සමුච්චිත ක්ෂය වෙන්කිරීම |
|---|---|---|---|---|---|
| 2105 | ගාඩනැගිලි | 165,178.94 | 94,872.52 | 0.00 | **260,051.46** |
| 2104 | මෝටර් රථ | 4,216,799.00 | 0.00 | 0.00 | **4,216,799.00** |
| 2101 | කාර්යාල උපකරණ | 616,542.49 | 366,296.22 | 22,370.00 | **960,468.71** |
| 2101 | ගෘහ භාණ්ඩ හා සවි කිරීම ප්‍රධාන කාර්යාලය | 191,349.47 | 159,062.38 | 0.00 | **350,411.85** |
| | අම්පාර | | 322.50 | | **322.50** |
| | එකතුව | **5,189,869.90** | **620,553.62** | **22,370.00** | **5,788,053.52** |

ලියා හළ අගය

| ගිණුම් කේතය | විස්තරය | 2015. 12. 31. දිනට ලියා හළ අගය |
|---|---|---|
| **2105** | ගාඩනැගිලි | 4,041,766.10 |
| **2104** | මෝටර් රථ | 1.00 |
| **2101** | කාර්යාල උපකරණ | 3,087,245.04 |
| **2101** | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් ප්‍රධාන කාර්යාලය | 2,146,877.36 |
| | අම්පාර | 3,977.50 |
| | එකතුව | **9,279,867.00** |

වෙළඳ හා වෙනත් අය විය යුතු දෑ

| පූර්ව වර්ෂයේ මුදල | විස්තරය | මුදල 2016 | කාල විශ්ලේෂණය | | සටහන 03 |
|---|---|---|---|---|---|
| | | | අවුරුදු 01 | අවුරුදු 02 | |
| | කාර්‍ය මණ්ඩල ණය | | | | |
| 6,853.75 | වැටුප් වැඩිපුර ගෙවීම් | 6,853.75 | | 6,853.75 | I |
| 13,500.91 | ගම්පොල නිවාස ණය | 13,500.91 | | 13,500.91 | II |
| 1,900.00 | විශේෂ අත්තිකාරම් | 15,500.00 | 14,000.00 | 1,500.00 | III |
| 13,126,063.79 | ආපදා ණය | 19,139,990.17 | 16,298,000.00 | 2,841,990.17 | IV |
| 488,238.57 | 2012 වාහන ණයගැතියන් | 273,157.05 | | 273,157.05 | V |
| 385,115.33 | 2013 වාහන ණයගැතියන් | 223,240.33 | | 223,240.33 | VI |
| 23,336.95 | උත්සව අත්තිකාරම් | 64,836.95 | 50,000.00 | 14,836.95 | VII |
| | මෝටර් සයිකල් රක්ෂණ | 607,984.95 | 607,984.95 | | VIII |
| 50,998.25 | කාර්ය මණ්ඩල ණයගැතියන් ගැළපීම | 50,998.25 | | 50,998.25 | |
| 55,554.70 | වැටුප් වැඩිපුර ගෙවීම හා විදේශ ගමන් ගාස්තු | | | | |
| (13,500.91) | අඩමාණ ණයගැති සඳහා වෙන්කිරීම | (13,500.91) | | (13,500.91) | |
| **14,138,061.34** | උප එකතුව | **20,382,561.45** | **16,969,984.95** | **3,412,576.50** | |
| | | | | | |
| | වෙනත් ණයගැතියන් | | | | |
| 2,094,280.65 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව | 2,094,280.65 | | 2,094,280.65 | IX |
| 339,229.75 | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී | 471,383.52 | 471,383.52 | | X |
| 12,750.00 | ලැබිය යුතු ස්ථාවර ආපදාණය පොළී | 21,749.88 | 8,999.88 | 12,750.00 | |
| 40,000.00 | පල්ලේකැලේ ළදරුපාසල | 40,000.00 | | 40,000.00 | |
| | ප්‍රදර්ශණ | 89,383.62 | 89,383.62 | | |
| 1,469.87 | ඉන්ධන අත්තිකාරම් | 1,469.87 | | 1,469.87 | |
| 86,449.87 | ලැබිය යුතු පල්ලෙකැලේ ගොවිපලේ ආදායම | 109,841.08 | 109,841.08 | | |
| 17,300.00 | ලැබිය යුතු කොත්මලේ ගොවිපලේ ආදායම | 56,473.50 | 56,473.50 | | |
| **2,591,480.14** | උප එකතුව | **2,884,582.12** | **736,081.60** | **2,148,500.52** | |
| **16,729,541.48** | එකතුව | **23,267,143.57** | **17,706,066.55** | **5,561,077.02** | |

ප්‍රධාන කාර්යාලය
සටහන් 04

## කලින් ගෙවීම්

| පූර්ව වර්ෂයේ මුදල | විස්තරය | මුදල | කාල විශ්ලේෂණය | |
|---|---|---|---|---|
| | | 2016 | අවුරුදු 01 | අවුරුදු 01 න් ඉහළ |
| 1,000.00 | සුරැකුම් තැන්පතු - ජල සම්පාදන මණ්ඩලය | 1,000.00 | | 1,000.00 |
| 6,000.00 | තැන්පතු - විදුලි බල මණ්ඩලය | 6,000.00 | | 6,000.00 |
| **7,000.00** | එකතුව | **7,000.00** | - | **7,000.00** |

ප්‍රධාන කාර්යාලය
සටහන් 05

ස්ථාවර තැන්පතු

| පූර්ව වර්ෂයේ මුදල | විස්තරය | මුදල 2016 |
|---|---|---|
| 1,000,000.00 | 057-60-01-00010198-9 | 1,000,000.00 |
| 1,000,000.00 | 057-60-01-00010199-8 | 1,000,000.00 |
| 6,000,000.00 | 057-60-01-00014482-6 | - |
| **8,000,000.00** | **Total** | **2,000,000.00** |
| | | |

අලෙවි අංශය

සටහන් 06

## ආරක්ෂක ඇප තැන්පතු

| අංකය | නම | ගිණුම් අංක | මුදල (රු) | 2016-12-31 දිනට පොළිය | මුළු මුදල (රු) |
|---|---|---|---|---|---|
| 1 | එස්.කළුතන්තිරිගේ | 057200110001187 | 5,000.00 | 1,869.73 | 6,869.73 |
| 2 | ඒ. සෙනෙවිරත්න | 057200241358179 | 5,000.00 | 1,869.73 | 6,869.73 |
| 3 | චමිල සම්පත් කුමාර | 057200190001188 | 5,000.00 | 1,869.73 | 6,869.73 |
| 4 | එච්.එම්.කේ.යටවර | 057200241239780 | 1,500.00 | 147.46 | 1,647.46 |
| එකතුව | | | **16,500.00** | **5,756.65** | **22,256.65** |

සටහන් 06-1

## ඉතිරිකිරීමේ ගිණුම

| | | | |
|---|---|---|---|
| 1 | මහජන බැංකුව | 057-200-11-00-14854 | 469,457.65 |
| 2 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 433-011-111-00-44 | 382,899.38 |
| 3 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 433-111-000-55 | 3,662.06 |
| 4 | අම්පාර අලෙවිසැල | 057-200-121-338-201 | 500.00 |
| එකතුව | | | **856,519.09** |

## මුදල් ශේෂය

සටහන් 07

| | | | |
|---|---|---|---|
| 1 | මහජන බැංකුව | 057-1-001-4-1338201 | 3,486,254.63 |
| 2 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 015-1-001-2-1338028 | 335,535.61 |
| එකතුව | | | **3,821,790.24** |

මුදල් ශේෂය

| 2015 වර්ෂය | විස්තරය | 2016 මුදල |
|---|---|---|
| | A/C - 057100111338028 | 0.00 |
| 85,839.51 | A/C - 057100131338046 | 1,185,357.52 |
| 88,913.54 | A/C - 057100300018375 | 409,708.25 |
| 24,181.41 | A/C - 057100130018376 | 115,381.75 |
| 6,116,876.11 | A/C - 100152006430 | 4,055,709.90 |
| 406,560.12 | A/C - 057200140019713 | 467,617.61 |
| **6,722,370.69** | එකතුව | **6,233,775.03** |

ප්‍රධාන කාර්යාලය

සටහන් අංක 08

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ

| පූර්ව වර්ෂයේ මුදල් | විස්තරය | මුදල 2016 | කාල විශ්ලේෂණය | |
|---|---|---|---|---|
| | | | අවුරුදු 01 | අවුරුදු 01 වැඩි |
| 5,000.00 | මහනුවර ආරක්ෂක සේවය | 5,000.00 | | 5,000.00 |
| 600,000.02 | පල්ලේකැලේ ගොවිපල් ණය | 550,000.02 | | 550,000.02 |
| 118,137.50 | රඳවා ගැනීම | 164,395.80 | 164,395.80 | |
| 42,500.00 | ආපසු ගෙවන තැන්පතු | | | - |
| 51,891.99 | පාංශු සංරක්ෂණ තැන්පතු | | | - |
| | අලෙවි අංශයට ගෙවිය යුතු වත්කම් විකුණුම් මුදල් | 10,210.00 | 12,320.00 | |
| 2,064.90 | විවිධ අත්තිකාරම් | 2,064.90 | 2,064.90 | |
| 7,595,333.38 | අලෙවි අංශයෙන් ලබා ගත් ණය | 10,088,623.90 | 9,400,000.00 | 688,623.90 |
| 575,000.00 | අලෙවි අංශ (දොෂය) | 575,000.00 | | 575,000.00 |
| | අලෙවි අංශයෙන් ලබා ගත් ණය ( පල්ලේකැලේ හා කොත්මලේ ගොවිපල) | 204,150.46 | 204,150.46 | |
| **8,989,927.79** | එකතුව | **11,599,445.08** | **9,782,931.16** | **1,818,623.92** |

ප්‍රධාන කාර්යාලය

සටහන් 09

උපචිත වියදම්

| වැය ශීර්ෂය | විස්තරය | මුදල |
|---|---|---|
| 1404 | දුරකථන | 68,628.73 |
| 1401-i | විදුලිය | 20,052.08 |
| 1404-ii | ජලය | 7,029.31 |
| 1404-G | නීති ගාස්තු | 103,750.00 |
| KO 105 | දුරකථන | 214.08 |
| KO 104 | විදුලිය | 421.25 |
| PL 102 | ගොවිපල් දීමනා | 3,000.00 |
| PL 103 | දුරකථන | 4,737.02 |
| PL 104 | විදුලිය | 8,445.44 |
| PL 105 | ජලය | 269.10 |
| | විගණන ගාස්තු - 2014 | 300,000.00 |
| | 2015 | 350,000.00 |
| | 2016 | 400,000.00 |
| එකතුව | | **1,266,547.01** |

## ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

### මහා භාණ්ඩාගාර හා අමාත්‍යාංශ අරමුදල් 31-12-2016

| | | |
|---|---|---|
| මහා භාණ්ඩාගාර අරමුදල් | | (Rs.) |
| | පුනරාවර්තන | 61,190,000.00 |
| අඩුකලා | ප්‍රාග්ධන වියදම් සදහා මාරු කල මුදල | (2,189,749.43) |
| | | **59,000,250.57** |
| | ප්‍රාග්ධන | 56,672,000.00 |
| එකතු කලා | පුනරාවර්ථන ප්‍රතිපාදන මගින් ලබා ගත් මුදල | 2,189,749.43 |
| | එකතුව | **58,861,749.43** |

වෙනත් ආදායම්

| ගිණුම් කේතය | විස්තරය | මුදල 2016 |
|---|---|---|
| 3001 | ගෙවල් කුලිය | 7,500.00 |
| | කුලී | 1,881,000.00 |
| 3007 | ආපදා ණය පොළිය | 495,793.68 |
| 3004 | අධිභාර | 2,400.00 |
| 3009 | විවිධ ආදායම් | 222,901.00 |
| 3003 | සැපයුම් කරුවන් ලියාපදිංචි ගාස්තු | 25,500.00 |
| | ගවයන් සඳහා අධිභාරය ආදායම් | 12,183.00 |
| | කාර්යාලීය වාහනයේ අය කර ගැනීම | 8,200.00 |
| | චක්‍රීය අරමුදල් පොළිය | 60,474.95 |
| | සන්නිවේදන ස්ථාවර තැන්පතු පොළිය | 266,208.56 |
| එකතුව | | **2,982,161.19** |

අලෙවි අංශය
උපලේඛණ 02

වෙනත් ආදායම්

| විස්තරය | මුදල (රු) |
|---|---|
| සැපයුම් කරුවන් ලියාපදිංචි ගාස්තු | 36,400.00 |
| වෙනත් ආදායම් | 491,350.96 |
| පොළී ආදායම් | 899,500.31 |
| ප්‍රවාහන ආදායම් | 12,555.00 |
| එකතුව | **1,439,806.27** |

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

මගේ අංකය / எனது இல. / My No. } සීඑල්පී-එල්/කේඩී/එච්/එච්ඒ/1/16/2017/35 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 සැප්තැම්බර් 30 දින

සභාපති

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය.

**ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම නීතිගත සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2017 ජූලි 17 දින නිකුත් කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.5,679,700 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 69 වගන්තිය පරිදි වත්කමක් පාවිච්චිය ආරම්භ කළ දිනයේ සිට ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත් ඊට පටහැනිව වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් අධිකාරිය විසින් අනුගමනය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 අනුව රු.6,788,124 ක් වූ තොග, අගය කිරීමේ පදනම සහ තොග සම්බන්ධයෙන් භාවිතා කළ පිරිවැය සූත්‍රයද ඇතුළුව තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වැටුප් රු.2,999,102 ක් සේවා නියුක්ත භාරකාර අරමුදලට ගෙවිය යුතු රු.89,973ක් හා සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු රු.359,892ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු.270,527 ක්වූ පාරිතෝෂික වියදම සහ පාරිතෝෂික වෙන් කිරීම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 ජනවාරි 17 වන දින අවලංගු කරන ලද රු.5,000,000 ක් වටිනා සත්නිවේදන තැන්පතුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී 2016 දෙසැම්බර් 31 දිනට අවලංගු කළා සේ සලකා මුදල් පොතට හර කර තිබීම හේතුවෙන් ආයෝජන එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද, බැංකු හා මුදල් ශේෂ එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

(ඈ) අධිකාරිය සතු රු.5,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතුව වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට අදාළ රු.105,548 ක පොලී මුදල ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ගොඩනැඟිලි | 228,550 | අයිතිය සහ භෞතික පැවැත්ම සනාථ කිරීමේ ලියවිලි |
| ලැබිය යුතු ශේෂ | 287,188 | ශේෂ සනාථ කිරීම් |
| ගෙවිය යුතු ශේෂ | 595,488 | ශේෂ සනාථ කිරීම් |

### 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

අධිකාරිය හා අලෙවි අංශය මගින් පවත්වාගෙන යනු ලබන ගිණුම් හා උපලේඛන අතර අවස්ථා 04 කදී රු.398,476 ක වෙනසක් පැවතුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.219,232 ක් වටිනා ලැබිය යුතු ශේෂ 37 ක් නිරවුල් නොකර පැවති අතර, එම ශේෂ වසර 01 සිට වසර 07 දක්වා කාල පරාසයකට අයත් විය.

(ආ) වර්ෂයකට අධික කාලයක් නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය නොවී පවතින රු.115,562 ක සේවක ණය ශේෂ 06 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ සේවයෙන් ඉවත් වී සිටි නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.239,533 ක සේවක ණය අදාළ නිලධාරියාගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.609,727 ක් වටිනා ගෙවිය යුතු ශේෂ 04 ක් නිරවුල් නොකර පැවති අතර, එම ශේෂ වසර 01 සිට වසර 10 දක්වා වූ කාල පරාසයකට අයත් විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණු 2014 වර්ෂයේ සිට පැවත එන හඳුනා නොගත් "කාර්ය මණ්ඩල ණය ගැලපුම්" ගිණුමේ වූ රු.50,998 ක ශේෂය 2017 අගෝස්තු මාසය වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396(ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මාස 06 ඉක්මවූ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ රු.775,500 ක් වටිනා චෙක්පත් 207 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ආයතනය තුළ ඇඟිලි සලකුණු යන්ත්‍රයක් ක්‍රියාත්මක වුවද ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් ලබාගත් පිටපතකින් පැමිණි හා පිටවූ වේලාවන් තහවුරු කර නොගෙන නිලධාරීන්ගේ පාලනය යටතේ පවත්වා ගන්නා ලද පැමිණීමේ ලේඛනය පදනම් කරගෙන රු.1,817,943 ක අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | (i) 2016 දෙසැම්බර් 31 වන දින වන විට නොපියවූ තත්කාර්යය අතුරු අග්‍රිම ශේෂය රු.607,984 ක් වූ අතර එය පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>(ii) ආයතනයේ නිලධාරීන් විසින් 2016 වර්ෂය තුළදී අවස්ථා 30 කදී ලබාගත් රු.261,120 ක අත්තිකාරම් මුදල් අදාළ කාර්යය නිම වී දින 14 ත් දින 262 ත් අතර කාල පමාවකින් පියවා තිබුණි.<br><br>(iii) නිලධාරීන් 27 දෙනෙකුට ලබාදෙන ලද රු.365,280 ක අත්තිකාරම් මුදලින් රු.226,070 ක් ප්‍රයෝජනයට නොගෙන නැවත පියවා තිබුණු අතර එය සියයට 28 සිට සියයට 100 ක පරාසයක් විය. |
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.5.1 ඡේදය | වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ඩීඑම්එස්/ඊඅයි/14/05/115(VOL1) දරන ලිපියට අනුව කාර්යක්ෂමතා දීමනා ගෙවීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කර නැවත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත් 2017 මාර්තු 31 දින වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු නොකර 2016 වර්ෂය වෙනුවෙන් රු.619,440ක් වටිනා කාර්යක්ෂමතා දීමනා ගෙවා තිබුණි.

(ආ) අලෙවි අංශයේ සේවකයින් වෙනුවෙන් අවදානම් තත්ත්වයකට මුහුණදීමට සිදුවන අවස්ථාවක වියදම් දැරීම සඳහා පිහිටුවා ඇති අවදානම් සංචිත අරමුදල වෙනුවෙන් 2011 සැප්තැම්බර් සිට 2016 දෙසැම්බර් 31 දක්වා ආයතනයේ අරමුදලින් බැර කරන ලද රු.469,457 ක් හා තව දුරටත් බැර කළයුතු රු.37,000 ක් වශයෙන් එකතුව රු.506,457 ක් සම්බන්ධයෙන් ක්‍රමවේදයන් හා නිර්ණායක සකස් කර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට කළමණාකාරීත්වය අපොහොසත් වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,359,802 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.798,108 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.561,694 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර පුනරාවර්තන ලැබීම් රු.1,639,421 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.32,601,898 ක් වූ ඌනතාවය 2013 වර්ෂයේදී රු.23,704,832 ක අතිරික්තයක් වී තිබුණි. 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අතිරික්තයක් නිරීක්ෂණය වුවද 2013 වර්ෂයට සාපේක්ෂව එම අතිරික්තයන්හි අඩුවීමක් නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.9,746,179 ක දායකත්වය උච්චාවචනයන් සහිතව 2016 වර්ෂයේදී රු.72,492,946 ක් වී තිබුණි.

### 3.2 අධිකාරියට එරෙහිව සහ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර පාර්ශවයන් විසින් අධිකාරියට එරෙහිව අධිකරණයේ නඩු 04 ක් පවරා තිබුණු අතර, අධිකාරියේ සම්පත් අවභාවිතා කිරීම සම්බන්ධයෙන් රු.40,178 ක මුදලක් අය කර ගැනීම සඳහා අධිකාරිය විසින් හිටපු සේවකයෙකුට එරෙහිව අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1972 අංක 11 දරන කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත අනුව ආයතනයේ අරමුණු පහත දැක්වේ.

(අ) කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය සහ පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමනාකරණය සඳහා සැලසුම් සකස් කිරීම සහ අමාත්‍යවරයා විසින් කලින් කළ නිශ්චය කරනු ලබන ප්‍රදේශවල සංස්ථාව විසින් හෝ ආණ්ඩුවේ නැතහොත් ආණ්ඩුවේ නොවන නියෝජිත ආයතන මඟින් හෝ එම සැලසුම් සම්බන්ධිකරණය කිරීම හා ක්‍රියාවේ යෙදවීම.

(ආ) සංස්ථාව වෙත සතු කරන ලද හෝ පවරන ලද සියලු ඉඩම්, උපරිම ඵලදාව, පරිසරය රැකීම, ඉඩම් සහ ජල සම්පත් සංරක්ෂණය සහ ජනාවාස සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථයෙන් කළමනාකරණය කිරීම.

(ඇ) කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම සහ අලෙවි කිරීම.

(ඈ) කෘෂිකාර්මික විවිධාංගීකරණය සහ ජනාවාස සංවර්ධනය සඳහා පිරියත, උපකරණ සහ යන්ත්‍රෝපකරණ පිහිටුවීම, ඒවා නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ඉ) ඉහත (අ) ඡේදයෙහි නිශ්චිත ප්‍රදේශවල කෘෂිකාර්මික විවිධාංගීකරණය, ජනාවාස සංවර්ධනය සහ දියබෙත්ම කළමනාකරණය ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන සියලු පියවර ක්‍රියාත්මක කිරීම.

එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කෘෂිකාර්මික විවිධාංගකරණය, ජනාවාස සංවර්ධනය, කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම, ආදී කටයුතු වර්ෂය තුළ සිදු කර නොතිබුණි.

(ii) සංවර්ධන කටයුතු සඳහා රු.57,650,130 ක මුදලක් භාණ්ඩාගාරය විසින් ලබාදෙනු ලැබුවද එම මුදලට අමතරව රු.5,588,163 ක් ආයතනය විසින් ද යොදවා පාංශු සංරක්ෂණ කටයුතු පමණක් සිදුකර තිබුණ අතර පනතේ සඳහන් වෙනත් සංවර්ධන කටයුතු කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(iii) සැලසුම්කරණය හා ප්‍රගති සමාලෝචනය සඳහා ඇස්තමේන්තු ගත රු.350,000 ක මුදලෙන් රු.101,144 ක් හෙවත් සියයට 29 ක කාර්යයන් පමණක් සිදුකර තිබුණි.

(iv) සමස්ථ ඉලක්කය හා සමස්ථ ප්‍රගතිය සැලකීමේදී ඉහළ ප්‍රගතියක් පෙන්නුම් කළද ග්‍රාම නිලධාරී වසම් 25 කට අදාළව හෙක්ටයාර් 584.64 ක පාංශු සංරක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1978 වසරේ සිට පැවත එන ගිණුම් 03 කට අදාළව රු.2,081,413 ක සංචිත ශේෂයන් පවත්වාගෙන යාමේ අරමුණු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අලෙවිසැලේ දෛනිකව එකතු වන මුදල් වහාම බැංකු ගත කළ යුතු වුවද 2016 දෙසැම්බර් 30 සිට 2017 ජනවාරි 10 දින දක්වා අවස්ථා 12 කදී රු.162,425 ක් සහ රු.1,111,401 ක් දක්වා පරාසයක් තුළ මුදල් අත රඳවාගෙන තිබුණි. සුළු වියදම් වෙනුවෙන් වැය කිරීම වෙනුවෙන් සුළු මුදල් අග්‍රිමය ලෙස රඳවාගත යුතු මුදල් සීමාවක් කළමනාකාරීත්වය මගින් අනුමත කර නොතිබුණි.

(ඇ) සිසුන්ගේ, දෙමාපියන්ගේ ශ්‍රමදායකත්වය යටතේ සංවර්ධන වැඩසටහන් සිදු කළ යුතු වුවද ඉන් බැහැරව, පාසැල් 40 ක සකස් කරන ලද ආදර්ශන සඳහා රු.641,209 ක් හා පාංශු ආදර්ශන 11 කට අදාළව කුලී වශයෙන්රු.178,910 ක් බාහිර පාර්ශවයන්ට ගෙවා තිබුණි.

(ඉ) අලෙවිසැල සඳහා නොලැබුණු එළවළු වෙනුවෙන් 2014 හා 2015 වර්ෂවලදී වැඩිපුර ගෙවා තිබුණු එකතුව රු.1,739,764 ක් සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් රු.575,000 ක් පමණක් අයකර ගෙන තිබුණද ඉතිරි රු.1,164,764 ක් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ඊ) අධිකාරියේ නිලධාරියෙකු පදිංචි වී සිටින රජයේ නිවාසය වෙනත් අමාත්‍යාංශයකට අයත් නිවාසයක් වූ අතර එය විධිමත් පරිදි පවරාගෙන නොතිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගන්නෝරුව සහ අම්පාර අලෙවිසැල්වල මිලදී ගැණුම්වලට සාපේක්ෂව අපතය වටිනාකම් පිළිවෙලින් රු.1,899,383 ක් හෙවත් සියයට 2.3 ක් හා රු.302,418 ක් හෙවත් සියයට 17.8 ක් වූ අතර, ගන්නෝරුව අලෙවිසැලට සාපේක්ෂව අම්පාර අලෙවිසැලේ අපතය ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) පල්ලේකැලේ හා කොත්මලේ ගොවිපළවල 2015 වර්ෂයේදී පිළිවෙලින් රු.1,326,129 ක් හා රු.74,999 ක්ද, 2016 වර්ෂයේදී පිළිවෙලින් රු.219,382 ක් හා රු.153,649 ක් අලාභ ලබා තිබුණ ද වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ 2015 මාර්තු 04 දිනැති අංක 04/04/07 දරන ලිපියේ 07 ඡේදය පරිදි ව්‍යාපාර සැලැස්මක් සකස් කර ගොවිපලවල් ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවිධ ව්‍යාපෘතින් වෙනුවෙන් මිලදීගත් වසර 05 කට වඩා පැරණි රු.716,170 ක් වූ කෘෂි උපකරණ 2017 ජනවාරි 05 දින වන විටත් ගබඩාවේ පැවතුණි.

(ආ) අක්කර 10 ක් පමණ වූ පල්ලේකැලේ ගොවිපළට අයත් මුළු ඉඩම් ප්‍රමාණය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) වැලිගම අලෙවිසැල සඳහා රු.124,707 ක් වටිනා භාණ්ඩ 2016 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී මිලදී ගෙන තිබුණු නමුත් 2017 ජුනි 30 දින වන විටත් වැලිගම අලෙවිසැල විවෘත කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම භාණ්ඩ නිෂ්ක්‍රියව පැවතුණි.

(ඈ) 2014 වර්ෂයේ සංවර්ධන වැය ශීර්ෂයෙන් රු.5,442,792 ක් වැය කර අඩක් නිමකළ ඉංගිරිය අලෙවිසැල් ගොඩනැඟිල්ල විගණන දිනය වූ 2017 ජනවාරි 31 දින වන විටත් ඉදිකිරීම් අවසන් කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉංගිරිය අලෙවි සැල

(i) කොන්ත්‍රාත්කරු වෙත ඉටු නොකරන ලද වැඩ අයිතමයන් 04 ක් සඳහා රු.105,100 ක් වටිනා ගෙවීම් කර තිබුණි.

(ii) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 04 වැනි පරිච්ඡේදයේ 4.1.1(ඇ) මාර්ගෝපදේශය අනුව ප්‍රතිපාදන ඇති බවට තහවුරු කර නොගෙන රු.1,223,499 ක් වටිනා අලෙවි මධ්‍යස්ථානයේ වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් 2014 අගෝස්තු 07 දින ආරම්භ කර අඩක් නිමකර ඇතත් මුදල් නොමැතිවීම නිසා 2017 ජුනි වන විටත් ඉදිකිරීම් අතරමග නවතා තිබුණි.

(iii) එළවළු හා කෘෂි ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා ඉදිකරන ලද අලෙවිසැලේ ඉදිකිරීම් කටයුතු සඳහා අදියර 09 ක් යටතේ රු.16,570,000 ක ඇස්තමේන්තුවක් සකස් කර එම ඇස්තමේන්තුව අනුමත කර තිබුණද තවදුරටත් අවශ්‍ය රු.10,570,164ක අරමුදල් සපයා ගැනීම සම්බන්ධයෙන් සැලැස්මක් සකස් කර නොතිබුණි.

(iv) අලෙවිසැලේ ඉදිකිරීම් කටයුතු අදියර 4 ක් යටතේ සිදු කිරීමට එකතුව රු.6,478,698 කට ඇස්තමේන්තු සකස්කර තිබුණි. එයින් අදියර 3 ක් සඳහා පමණක් ලංසු කැඳවා මිල ගණන් ඉදිරිපත් කර තිබුණු එකම ලංසුකරු වෙත අදියර 4 හිම ඉදිකිරීම් පවරා තිබුණි.

(ආ) වැලිගම අලෙවිසැල

(i) 2014 පළාත් නැඟුම වැඩසටහන යටතේ රු.8,062,196 ක් සහ හදබිම අධිකාරියෙන් රු.2,112,501 ක් වැයකර අඩක් නිමකර 2015 ඔක්තෝබර් 18 දින අධිකාරියට භාරදී තිබුණු අලෙවිසැල් ගොඩනැගිල්ලේ ස්ථාන කිහිපයකම බිත්ති පුපුරා ඉරිතලා ගොස් තිබුණු අතර, ඇතැම් ස්ථානවල වේයන් විසින් හුඹස් බැඳ තිබුණි. ඒවා නැවත සකස් කර අලෙවි කටයුතු ආරම්භ කිරීමට 2017 මාර්තු 27 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ii) බිල්පතෙහි සඳහන් රු.44,086 ක ඉටු නොකරන ලද අයිතම 03 ක් සඳහා ගෙවීම් කර තිබුණි.

(iii) පවුඩර් කෝර්ටඩ් ග්ලාස් දොරවල් (Powder Corted glazed door) වෙනුවෙන් රු.150,132 ක මුදලක් ගෙවා තිබුණද එම දොරවල් සඳහා පවුඩර් කෝර්ටඩ් පමණක් යොදා ඇති අතර ග්ලාස් යොදා නොතිබුණි.

(ඇ) 2016 වර්ෂය තුළදී රු.1,081,657 ක් වටිනා ද්‍රව්‍ය මිලදී ගැනීම් හා රු.528,700 ක පවිත්‍රතා සේවාව වෙනුවෙන් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 හා 8.9.1(ආ) මාර්ගෝපදේශ අනුව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු අතර ලිඛිත ගිවිසුමකටද එළඹ නොතිබුණි.

## 4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

2017 ජූනි 30 දින වන විටත් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම් 02 ක පිළිවෙලින් රු.5,442,792 ක් හා රු.10,174,698 ක් වැය කර අලෙවිසැල් 02 ක් ඉදිකර තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජූනි 15 දිනැති අංක ඩීඑම්එස්/1578 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය පරිදි අනුමත කර තිබුණු කාර්මික සහායක තනතුර සඳහා 2017 මාර්තු 31 වන විටත් බඳවා ගැනීම් සිදුකර නොතිබූ අතර, බඳවා ගැනීම් පරිපාටියද අනුමත කර ගෙන නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 04 දෙනෙකුගේ කොන්ත්‍රාත් කාලය අවසන් වී තිබියදීත් ගිවිසුමක් නොමැතිව හා කාලය දීර්ඝ කිරීමකින් තොරව 2015 නොවැම්බර් සිට 2017 මාර්තු දක්වා කාලය සඳහා දළ වැටුප් වශයෙන් රු.2,203,880 ක් ගෙවා තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ මූල්‍ය නිලධාරී හා මුරකරු තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන 2017 පෙබරවාරි 28 දින තෙක් වැටුප් වශයෙන් රු.409,945ක් ගෙවා තිබුණි.

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඈ) මුදල් රෙගුලාසි 71(i)(ආ) රෙගුලාසියෙන් බැහැරව අලෙවි ව්‍යාපෘතිය යටතේ අනුමත අලෙවි සහායක තනතුරු 21 තුළට බිල්පත් එකතු කරන්නා ලෙස තනතුරු නාමය වෙනස් කරමින් නිලධාරීන් 06 දෙනෙකු බඳවාගෙන 2016 වර්ෂය තුළ වැටුප් වශයෙන් රු.1.756.754 ක් ගෙවා තිබුණි.

4.8 වාහන උපයෝජනය
------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජුලි 15 දිනැති ලිපියට අනුව රු.1.120.000 ක් වූ අත්ට්‍රැක්ටර් 10 ක් ගොවි සංවිධාන වෙත පවරා දීමට අනුමැතිය ලබාදී වසරකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද පවරාදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෘෂිකර්ම අමාත්‍යාංශයට නිත්‍යානුකූල අයිතිය පවතින පිරිවැය රු.900,000 ක ලොරි රථයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එහි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
----------------------------------------------
5.1 ක්‍රියාකාරී සැලැස්ම
------------------------
2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 5.2 ඡේදය අනුව අලෙවි ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම
------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන සැලැස්ම අදාල වර්ෂය ආරම්භ වීමට පෙර පිළියෙල කර අනුමත කරවා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශ ලේකම් විසින් 2016 මාර්තු 31 දින අනුමත කර තිබුණු අතර සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර නොතිබුණි. අනුමත කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ රු.1.832,698ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ii) අධිකාරිය වෙනුවෙන් 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය අනුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර 2016 වර්ෂයේ අලෙවි ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදී ගැනීම් සඳහා පිළියෙල කරන ලද රු.41.900.000 ක ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ජාතික ප්‍රසම්පාදන සංග්‍රහය අනුව ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සහ අලෙවි ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය එක් නිලධාරියෙක් පමණක් වූ අතර. අභ්‍යන්තර විගණනය වෙනුවෙන් මිනිස් පැය 3900 ක් භාවිතා කර ක්ෂේත්‍ර 09 ක් යටතේ ක්‍රියාකාරකම් 33 ක් සිදු කිරීමට සැලැස්මක් සකස් කර තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරකම් 06 ක් පමණක් ආවරණය වන පරිදි විගණන විමසුම් 14 ක් පමණක් නිකුත් කර විගණකාධිපති වෙත යොමුකර තිබුණි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 63,238,292 ක් සංවර්ධන වියදම් සඳහා වැයකර තිබුණද ඒ සම්බන්ධයෙන් එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි

5.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 5.2.1 ඡේදය අනුව අයවැය ඇස්තමේන්තුව සමඟ අයවැය ගත ශේෂ පත්‍රයක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් හා ක්‍රියාකාරී සැලැස්ම සමඟ අයවැය ගත ප්‍රාග්ධන වියදම් වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 5.2.5 ඡේදය අනුව යාවත්කාලීන කරන ලද අවසන් අයවැය වාර්තාව වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර 5.2.4 ඡේදය අනුව කෙටුම්පත් අයවැය වාර්තාවක් වර්ෂය ආරම්භ වීමට මාස 03කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව තුළ ඇතුළත් රු.1,888,500 ක් වටිනාකමැති වියදම් විෂයයන් 07 ක සංශෝධනයන් සඳහා 2017 ජනවාරි 22 දින අනුමැතිය ලබාගෙන තිබුණි.

(ඈ) ඉහත නිරීක්ෂණ අනුව අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ අනෙකුත් ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් 2004 වර්ෂයට පෙර සිට අයවිය යුතු රු.2,094,280 ක මුදල පිළිබඳ 2010 පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී අවධානය යොමුකර එය විසඳීමට නියමකර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ද එය නිරවුල් කර ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර අධිකාරියේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ගිණුම්කරණ ප්‍රමිති හා ප්‍රතිපත්ති නිසි පරිදි අනුගමනය නොකිරීම. |
| (ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | වර්ෂ ගණනාවක සිට පැවත එන ණය ශේෂ පියවීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම/ශේෂ සනාථ කිරීම් නොමැතිවීම. |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා පැවතීම. |
| (ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත නොවූ තනතුරු සඳහා බඳවා ගැනීම හා පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම. |
| (ඉ) වාහන පාලනය | (i) වාහන පාලනය සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීම.<br>(ii) මාසික සාරාංශ සකස් නොකිරීම. |
| (ඊ) අභ්‍යන්තර විගණනය | (i) පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම.<br>(ii) අභ්‍යන්තර විගණන සැලැස්මට අනුකූලව කටයුතු කර නොතිබීම. |
| (උ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කර නොතිබීම. |
| (ඌ) අයවැය ලේඛනමය පාලනය | අයවැය ලේඛනය සකස් නොකිරීම හා මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා නොගැනීම. |
| (එ) වත්කම් පාලනය | නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම් පැවතීම |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති